
# නිර්නාමික හදවත



**YUNIROSE**

Sayuni Ambrose

# නිර්නාමික හදවත

**YUNIROSE**

S a y u n i   A m b r o s e

# නිර්නාමික හදවත

**සයුනි ඇම්බ්‍රෝස්**

ISBN 978-624-208-336-0

කතාව, පිටකවරය සහ පරිගණක අක්ෂර
සයුනි ඇම්බ්‍රෝස්

පාසල : විශාඛා විද්‍යාලය. කොළඹ 05.

නො.57/ 2, බෝගහතොටුපොල පාර, උස්වත්ත, කඳාන.
077 5796301

එළිදැක්වීම : 2025 පෙබරවාරි 08

# පිදුම

ගිනිකඳු පතුලක

ග්ලැසියර දරා සිටින

අසිනි වැසි අභියස

ඉබේටම දළු ලන

ඉඩෝරයකදී වුව

සුපුෂ්පිතව

ෆැන්ටසිය තුළ

යතාර්ථය විඳින

සොඳුරු මනුෂ්‍ය හදවත්වලට

පුදමි!

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදි කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොවනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# හදවත් පටුන

01 නාමික හදවත (කවි) ……………………………. 07

02 The Dark heart (Poem) ………………………... 08

03 අග්නි හදවත (කවි) ………………………………… 09

04 ගැහෙන හදවත (කවි) ……………………………… 10

05 කඩදාසි හදවත (කෙටි කතා)……………………... 11

06 The Iron Heart ( Poem) ………………………... 22

07 කවි හදවත (කවි) ……………………………….... 23

08 මියුරු හදවත (කවි) ………………………………….24

09 නිමල හදවත (කවි) ……………………………… 25

10 The Untamed Heart ( Short Story) …………….. 26

11 රුධිර හදවත (කවි) ………………………………… 43

12 නිර්නාමික හදවත (කෙටිකතා) ……………………44

## ***01 නාමික හදවත***

(නමට විතරක් මොකටද ?)

කෙටි කලක් නොව දස මසක් මා
රෝස දෙකොපුල, නුඹේ මදහස
මගේ දෝතට වඩා ගන්නට
පෙරුම් පිරුවා සත්තමයි පුත

දස පැයක් රෝහල් කුටිය තුළ
රැඳී කිරි සුවඳක් ද අද නැත
නුඹේ හැඬුමින් නිවුණු ගිනි දැල්
මගේ හැඬුමින් පණ ගනියි පුත

සැලෙන බෝපත් රිදී කළයත්
වැලි මලුත් දන්නව මගේ සිත
මාර සේනාවෙන් රකින ලෙස
පැතුවෙ නුඹට ම සතුට මගෙ පුත

දිනෙන් දින පෙති දිගහරින විට
නොපිපි මල පිපි අමාවක දින
යකඩ යකෙකුට බිලි පඬුර වන
මගේ දස මස විහිළුවකි ද පුත?

## ***02 The Dark Heart***

(The darkest)

Dawn is grey
Dead colors, thin clouds
Yet the first to be there
Sunrise is sharp
Which threatens sleep like bees
Sociable but unbearable
Noon is cruel - Burn like fuel
Yet it's the brightest
Evening is all about art
Mixture of bright colors
Clouds with different shades
Attractive and little bit radical
So stubborn eve!
Night is gentle
Let be at rest
Faithful - No complains
So loving and caring
That's why
I hate the night
When I open my eyes,
It's gone.

## *03 අග්නි හදවත*

( ගිනි මලක් පිපුණ වගයි)

සොහොනක තනි රකින තනි ගිනි සිළුව ලෙස
සුළඟට සැලෙන දැල්ලකි මේ හදමඬල
පහන තෙල් සිඳී යන සේ සිඳුණ විට
බලාපොරොත්තුවේ තෙල් පිඬ සොයනු කිම

ගිනි දල්වන්න හැකි නම් මහ සාගරය
නිසැකය හදේ ගිනි නොනිමී තිබෙනු ඇත
උදුනක් ඉදිරිපිට නොලැබෙන උණුසුමක
සුවයකි හදේ දැල්වෙන විට ඒ ගින්න

හුළු අතු වගේ ගිනි දැවෙනා විට නිබඳ
ඒ ගිනි පුලිඟු ගෙන යයි ඔබ, වෙත අහස
හදවත පිරෙන්නට හුස්මක් ඉහළ ඇද
පහතට හෙළනු මැන ගිනි පුලිඟු ද සමඟ

පොළොවට බැඳී අහසට නැගෙනා හරිත
ශාක ය, පෝෂණය කරනා මිහිතලය
එහි වූ පිපි මලක් ඵලයක් කරන්නට
බලයක් තිබේ ඔබ හෙලනා හුස්මකට

සැ. යු. :- ප්‍රශ්වාස වාතයේ අඩංගු කාබන් ඩයොක්සයිඩ් අමුද්‍රව්‍ය ලෙස ගෙන හරිත ශාක තුල ආහාර නිෂ්පාදනය කරනු ලැබේ.

***04 ගැහෙන හදවත*** **( හදවතක්මත් නෙවෙයි. මේක ජීවිතයක්.)**

යදම් විලසින් බැඳ දමා සිත්- කොටු කරන කොටු ඉරි පොතක්

නිදහස් කරන් නිදහස සොයන්- කළු අකුරු තැවරුණු මාවතක්

ඉරි නොමැත මඟ පවසන්න, තව දුර - යන්නමයි හිත පැවසුවේ

සිර වෙමි කැමැත්තෙන්

දමනු මැන දම්වැල්!

දමා ගැට ගසනු මැන සිත්මල්!

හෝරා ගණන් ගත වී තවත්

ඉවරයක් නැති එක කතාවක්

නෑ, ඔබ භාවනාවක්!

සමාධිය හොයන කලබල හිතට ඔබ

සාමයක්!

තව කාලයක් යන තුරා පවතින

සාදයක්!

ගීතයක්! තනු නොමැති පදවැල්

ගොතන සුමිහිරි තාලයක්!

ඉදින් කෙලෙසක සිර කරමි මම

මගේ සිත, තුළ පාඩමක්

සදා නොමියෙන ආලයක් මෙය

සදා නොමැකෙන මතකයක් ඔබ

පණ ඇති දෙයක්

ඒ ඔබ,

**පොතක්!**

# කඩදාසි

# හදවත

# 05 කඩදාසි හදවත

( වහා ගිනි ඇවිලෙන සුළුයි.)

"........ඉතින් චූටි හා පැටියා ගුල ඇතුළට රිංගුවා. කපටි නරියත් වේගෙන් දුවගෙන ආවා. හා පැටියට හුඟක් බය හිතුණා. එයා වේගයෙන් උස් පහත් වෙන පුලුන් වගේ පපුවට උඩින් අත් දෙක තියාගෙන ප්‍රාර්ථනා කළා. නරි හාමිට එයාව හොයගන්න පුළුවන් වෙන්න එපාය කියල. නරිහාමි ඉව අල්ල අල්ල ඇවිත් හා ගුල තිබුණු අඹ ගහ ළඟට කිට්ටු කළා.දැන් හා පැටියගෙ හදවත ගැහෙන්නෙ මුසලඩි වන්නමේ බෙර පදවලටත් වඩා වේගෙකින්ලු. නරිහාමි එක අඩියක් ඉස්සරහට තිබ්බා විතරයි එකපාරටම.........."

"අත්තම්මේ..................." අත්තම්මා කතාව නවත්වලා බැලුවෙ ගේ ඇතුලෙ ඉඳල එළියට ආපු සුවී දිහා.

"අදට ඔය කතා ඇති නේද? දෙන්නම ගිහින් මූණ කට සෝදගෙන ආවනම්" සුවීගෙ හා පැටව් දෙන්නා, ඒ කියන්නෙ මේ කෙලි පැටව් දෙන්නා, ඒ ඇහුණු පරක්කුවට මූණු ඇඹුල් කර ගත්තා. සුවී, දෙන්නා දිහාම රවල බැලුවා.

"මම පැණි ආප්ප හැදුවා." කියල ඉවර කරන්නත් කලින් ම හා පැටව් දෙන්නා නරි පැටව් දෙන්නෙක් වගේ ගේ ඇතුළට දුවගෙන ගියා.

අත්තම්මත් එක්ක අඹ ගස් හෙවණෙ තනි වූ සුවී නංගිලා දෙන්න දුවපු දිහා බලගෙන හිටියෙ 'මේ දෙන්නත් එක්ක කේන්ති අරන් ඉන්න මට බැරි හැටියක්' කියල හිත හිතයි.

නගරේ සුන්දරයි. ඒත් ගම හරිත වර්ණයට කැප වෙච්ච හරිම ආවේණික සුවයක් දෙන්න පුලුවන් භාවනාවක්. අත්තම්මගෙ පරණ තාලෙ ගේ වට කරගෙන හැදිල තියෙන එක එක ජාතියෙ ගස් වැල් දිහා එක සැරයක් දෙසැරයක් නෙවෙයි සියසැරයක් බැලුවත් එයාව හැඟීම්වලින් පිරිල යන්නෙ හරියට පළවෙනි දවස වගේමයි.

කොච්චර ගස් තිබ්බත් අත්තම්මට නම් හිතට අල්ලල යන්නෙ මේ මී අඹ ගහ තමයි. ඒකනේ මොන තරම් තද අව්වක් තිබුනත් සිසිල විතරක් දැනෙන ගහේ විශාල හෙවණැල්ලට යටින් ලී බංකුවක් තියාගෙන එතනට වෙලා ඉර බහිනකම් කතන්දර කියන්නෙ. සුවී අත්තම්ම ළඟින්ම ලී බංකුවේ වාඩි වුණා.

"අම්මා කතා කලාද දරුවෝ?" අත්තම්මගෙ හඬ හැඟීම් විරහිතයි. ඒත් හදවත ගිනි ගන්නව කියන්න සුවී දන්නවා. ඒ ඇස් නාභිගත වෙලා තිබුනෙ අහසම තැඹිලි පාට කරගෙන තව වතාවක් සමුගන්න බලාගෙන ඉන්න ඉර දිහාවටයි.

“තාම වැඩ ඉවර නැතුව ඇති. පස්සෙ කතා කරයි.” අත්තම්මගෙ මූණ පැත්තෙන් බලනකොට සුවීට පෙනුනේ අම්මගෙ මූණ වගේ. තව ටිකක් ලං වෙලා රැලි අඩු වුණොත් එයාගෙම මූණ වගේ. එයත් කවදාහරි මේ වගේ ගස්වලින් මුවා වෙච්ච වැලි පිරුණු මිදුලක මී අඹ ගහක් යට වාඩිවෙලා ඉර බහින දිහා මේ විදියට ම බලාගෙන ඉදියිද කියල සුවී කල්පනා කළා. සමහරවිට, ඔව්. මොකද මෙතන විඳින්න ගොඩක් හැඟීම් තිබුණා.

“මේ ළමයත් මූණ කට සෝදගෙන එන්නකෝ කෑම කන්න.” අත්තම්මා බංකුවෙන් නැගිට්ටා. පරණ ලී බංකුව කිරි කිරි ගෑවත් අත්තම්ම නම් යන්තන්වත් කෙඳිරි ගෑවෙ නෑ. තාම තරුණ ජවය එහෙම්මමයි.

“අත්තම්මේ.....” ගේ දිහාට යන්න හැරුණු අත්තම්මා ආපහු හැරිල බැලුවෙ මේ දහනවවියේ පොඩි කෙල්ල නාහෙන් අඬන්නෙ මොකටද කියල. “ ඊළඟ දවසෙ කතන්දර කියනකොට මටත් කතා කරන්න. හරිද?” සුවී හුරතලෙන් කිව්වා.

අත්තම්මා නුහුරට රවල ආයෙමත් හිනාවුණා. “ තව ටික දවසක් යද්දි මේ මී අඹ ගහත් කියාගෙන එයි අනේ අනේ අත්තම්මෙ මටත් කතන්දර කියන්නකෝ.... කියල. හරිනම් උඹයි මට කතන්දර කියල දෙන්න ඕනි.” තව මොනවදෝ මුමුණ මුමුණ අත්තම්මා ගේ ඇතුලට ගියා.

“ඇයි මී අඹ ගස් කතන්දර අහන්න ආස නැද්ද?” සුවී කෙලින්ම මී අඹ ගහ දිහාවට හැරිල ඇහුවේ. තරහින් නම් නෙවෙයි හිනාවකින්මයි. මී අඹ ගහේ ලා දලු වේගෙන් හෙලවුණේ කොච්චර ආසද කියල පෙන්නන්න වගේ. ඒ හුළඟින් විසිවුණු කොළ පවා ඇවිත් සුවීගේ මූණේ වැදුනෙ එයාව තවත් හිනස්සවමිනුයි.

“එතකොට ඔයා?” සුවී ලී බංකුවෙන් නැඟිටල මී අඹ ගහේ අතු පතර විහිදුණු ආධිපත්‍ය හමුවේ යන්තම් ඉරට මුහුණ දීගෙන හිටිය දෙහි ගහ ළඟට ගියා. මී අඹ ගහ වගේ එතරම් සංවාදශීලීබවක්වත් එතරම් සුහදශීලීබවක්වත් මේ දරදඬු දෙහි ගහේ තිබුනේ නෑ.

හුළඟ ඒ අතටත් මේ අතටත් දුව දුව මී අඹ ගහේ ලා දලු එක්ක සෙල්ලම් කලත් සුවීගෙ නිල් පාට ගවුමෙ රැලි එහෙට මෙහෙට තල්ලු කලත් මේ දෙහි ගහ ළඟට එන්න තරම් ධෛර්යයක් හුළඟටවත් නොතිබුණු තරම්.ඒ නිසා දෙහි ගහේ එක කොළයක්වත් හෙල වුනේ නෑ.

වේලුණු පොළොවෙන් උඩට මතුවෙලා අඩි හය හතක් උසට අවකාශය ආක්‍රමණය කරල තිබුණු මේ දෙහි ගහ දිහා සුවී හරිම උනන්දුවෙන් බැලුවා. දෙහි ගහ නම් මුරණ්ඩු විදියට අහක බලාගෙනම හිටියා. සුවීගෙ රෝස පාට කම්මුල් දිහා, නා දලු වගේ දෙතොල් දිහා, මිණි කැට වගේ ඇස් දිහා එක

වතාවක් වත් නොබල ඉන්න පුළුවන් වෙන්න තරම් මේ දෙහි ගහට කොච්චර නපුරු හදවතක් තියෙන්න ඕනිද? ඒ ආදරණීය හිනාව ඉස්සරහ රවාගෙන අහක බලන් ඉන්න විතරක් නෙවෙයි හුළඟටත් රිදෙන තරම් තියුණු කටු දික් කරගෙන ඉන්න තරම් ඒ හිත කොච්චර හැඟීම් විරහිත ඇත්ද?

පොළොවෙන් උඩට ඇදිල තිබුණු දෙහි ගහේ කඳ ඒ තරම් මහත නෑ. ඒ වුණාට හරිම දරදඬු කටුක පෙනුමක් කඳ පුරාවට තිබුණා. ඇඹරිලා ,ඇදවෙලා තිබුණත් ගුරුත්වය ඉස්සරහ දණ නොනමා කොහොමහරි කෙලින් ඉන්න පුළුවන් තරමට ඒ කඳ හයිය වෙලා තිබුණා. එච්චර අතු විහිදිලා තිබුණෙ නෑ. ඒත් මී අඹ ගහේ කොළ ඇත් මැත් කරගෙන ඉරට මුහුණ දෙන්න පුළුවන් අවකාශයක් හදාගන්න ඒ අතු සමත් වෙලා තිබුණා. කොළ මහ ගොඩක් තිබුණෙත් නෑ හැබැයි තිබුණු හැම කොළයක්ම මුහුකුරා ගිය තද කොළ පාට.මිනිස්සු කියනවනෙ කොළ පාට හිත නිවනවා කියලා. කොච්චර කොළ පාට වුණත් මේ දෙහි ගහ දකිනකොටනම් හිත නිවෙන්නෙ නෑ. මලක්වත් දල්ලක්වත් දකින්න නොතිබුණු මේ දරදඬු දෙහි ගහ ඉස්සරහ සුවීගෙ හිත මොළොක් වුණේ ඇයි දන්නවද? මී අඹ ගහේ සිසිල අතහැරල ඇවිත් කතා කරන්න තරම් දෙහි ගහ සුවීට කරපු බලපෑම මොකක්ද දන්නවද?

දෙහිගහ, මී අඹ ගහේ මායිමේ වැවිලා තිබුණාට ඒ වේලුණු දරදඬු දෙහි ගහේ කඳ ඇඹරිලා තිබුනේ අත්තම්මගෙ ලී බංකුව දිහාටයි. කෙලින්ම නොවුනත් හොරාට අත්තම්මගෙ කතන්දර අහන් ඉන්න වුවමනාවෙන් වගෙයි දෙහි ගහ ඒ පැත්තට ඇදවෙලා හැදිල තිබුණෙ. මනුස්සයෙක් එකපාරක් දැක්කොත් ආයෙත් වැරදිලාවත් බලන්න පෙලඹෙන්නෙ නැති මාරාන්තික විදිහට කටු විලිස්සගෙන ඉන්න දෙහි ගහ දිහා සුවී හරි උනන්දුවෙන් බැලුවෙ කවුරුවත් දකින්නෙ නැති මේ හොර වැඩේ දැකපු නිසයි. සමහර විට දෙහි ගහ සුවී දිහා බලන්නෙ නැත්තෙත් ඒ නිසා වෙන්න ඇති. එයා හොරෙන් අත්තම්මගෙ කතා අහගෙන හිටියා කියන එක අහුවුණ නිසා ලැජ්ජාවකින් වෙන්න ඇති අහක බලාගෙනම ඉන්නෙ. හැබැයි ඉතින් හරි මුරණ්ඩු පෙනුමකින් තමා අහක බලන් උනත් ඉන්නෙ. සුවී දෙහි ගහ දිහා බලල හිනා වුණා. එයාගෙ ප්‍රශ්නෙට උත්තරයක් ගන්න බැරි වුණත්.

"ළමයෝ!!! මොකද තවම ඔතනට වෙලා කරන්නේ?" අත්තම්මා ගේ ඇතුලෙ ඉඳලා වත්ත මායිමේ ගේට්ටුවට ළඟින් තිබුණු දෙහි ගහ ළඟ හිටිය සුවී ළඟට ඇවිදගෙන ආවා.

"මේ දෙහි ගහ බලන්නකො අත්තම්මේ." සුවී අත දික් කරල කිව්වෙ අත්තම්මගෙ කතන්දර හොරෙන් අහන් හිටිය හොරාව පෙන්නන ගමන්. හුළඟක් ඇවිත් සුවීව පහු කරන් දුවන කොටම දෙහි ගහ සුවී දිහාට තවත් කටු දික් කරන් රවල බැලුවා වගේ සුවීට ඇස් කොනින් පෙනුණා. ඒත් එයා හැරිල

බලනකොට දෙහි ගහ ආපහු අහක බලාගෙනමයි. හොඳ වෙලාවට අත්තම්මා කේලම තේරුම් ගත්තෙ නෑ. නැත්නම් දෙහි ගහේ නම්බුව අර දූවපු හුළඟත් එක්කම ගහගෙන ගිහින්.

" මහ කණාටු වෙච්ච ගහක්. ගුණවතීලගෙ වත්තෙ තිබ්බ හොඳට ගෙඩි හැදෙන ගහකින් ගත්තු පැළයක් වුණාට මොකද, මේ වෙනකම් එක ගෙඩියක් තියා ආසාවට දකින්න මලක්වත්, දල්ලක්වත් නෑ." අත්තම්මා අත් දෙක පිටිපස්සට බැඳගෙන දෙහි ගහේ උඩ ඉඳලා යටට බලල මෙහෙමත් කිව්වා. "මම ඉන්නෙ ළඟදිම මේ ගහ උගුල්ලල දාන්න. මෙතන ගේට්ටුව ළඟම නිසා දාන්න ඕන වද මල් පාත්තියක්." අත්තම්මා ඔළුව වන වන කල්පනා කලේ එයාගේ අනාගත වද මල් පාත්තිය ගැන. ඒ නිසාමද කොහෙදෝ එයාට දෙහි ගහ ඒ වචනවලට දක්වපු ප්‍රතිචාරය සම්පූර්ණයෙන් ම මඟඇරුණෙ.

ඒත් සුවී දැක්කා, උගුල්ලල දාන්න ඕන කියන කොටම දෙහි ගහ ගැස්සිලා ගිය විදිහ. ගණන් ගත්තෙ නෑ කියල බොරුවට පෙන්නගෙන ඉන්න දැඟලුවට ඒ දරඬු වෙච්ච කොළ බලාගෙන ඉදිද්දි වේලිලා ගිය විදිහ. හරියට අවුරුදු ගානකින් වතුර දැකලවත් නෑ වගේ. අත්තම්මා දිහාවත් සුවී දිහාවත් නොබල බිම බලාගෙන ඉන්න දෙහි ගහට ඇත්තටම තියෙන්නෙ නපුරු හදවතක්ද? හදවතක් නැතුවවත්ද?

"ඒත් අත්තම්මේ, අපරාදෙනේ. පොඩි සාත්තුවක් දාල ගත්තනම් හරි. බලන්නකො මේ ගහට හරි හමන් අච්චක්වත් වැටෙන්නෙ නැනේ." සුවීට පුදුම හිතුණා එයාගෙ මූණවත් බලපු නැති දෙහි ගහ වෙනුවෙන් එයාම කතා කරනකොට. ඒ වුණාට දෙහි ගහට ලැබෙන්න ඕනි අවස්ථාව ලැබිලා නෑ කියල එයාගෙ හිත තදින්ම විශ්වාස කළා.

"මම කොච්චර නම් සාත්තු කළාද? වැඩක් වුණායැ? දැන්නම් මට ඇති වෙලා තියෙන්නෙ. මේ යන්නෙ දෙහි වාරෙනේ. මේ වාරෙත් ගෙඩි නාවොත් උගුල්ලල ගිනි තියල දානවා.." අත්තම්මා දෙහි කටුවලටත් වඩා තියුණු විදිහට කියනකොට දෙහි ගහ අහක බලාගෙනම කටු ටික ළඟට අරගෙන අතු ටික අකුලගත්තා. දෙහි ගහේ මුරණ්ඩුකම පෙන්නන්න තියාගෙන හිටියා කියල හිතුණු කටු ඇත්තටම කරන්නෙ එයාව මේ දරුණු වචනවලින් ආරක්ෂා කරන එක වගෙයි සුවීට පෙනුණෙ.

"හා හා එන්නකො අත්තම්මෙ, අපි යමු ඇතුළට." සුවී අත්තම්මගෙ අතින් ඇදගෙන ගේ දිහාට ගියේ තව වෙලා ගියොත් කේන්තියට අත්තම්ම මොනව කියයිද කියල විශ්වාස නැති නිසා.

ගේ දිහාට අත්තම්මත් එක්ක ඇවිදගෙන යන සුවී දිහා අන්තිමේදි මුරණ්ඩු දෙහි ගහ හැරිලා බැලුවා. එයාගෙ කටුවලට බයේ පස්සට පනින අනිත් ගැහැනු ළමයි වගේවත්, යනගමන් එයාගේ කොළ කඩල නිකන් හප හප යන පිරිමි

ළමයි වගෙවත්, එයා දිහා නපුරු විදියට බලලා 'ගෙඩි නැත්තන් උගුල්ලල ගිනිතියනවා' කියන අත්තම්ම වගේවත් නැති මේ සුවී ගැන එයාටම දැනුණෙ හරිම සුවදායක හැඟීමක්. මී අඹ ගහ ඇරුණම වෙන කාටවත් සමීප නොවුණු දෙහි ගහට තේරුණේ නෑ සුවී දිහා බලලා කතා කරන්නෙ කොහොමද කියල. ඒ නිසා අහක බලාගෙනම ඉඳලා සුවී හැරිල යනකොට එයා දිහා බැලුවත් මොකද, සුවී ආපහු හැරෙයි කියලවත් හිනාවෙයි කියලවත් දෙහි ගහට හිතුණෙ නෑ. ඒත් එහෙම වුණාම එයාට කරන්න තිබුණෙ ගොඩනැඟුණු අලුත් මිත්‍රත්වයත් එක්ක හිනා වෙන එක නෙවෙයිද? ඒත් දඩබ්බර දෙහි ගහ ආපහු අහක බලාගත්තෙ එයා සුවී දිහා බලාගෙන හිටියෙම නැති ගානටයි.

කළු අහස යට ටිකෙන් ටික සීතල වේගෙන යන හුළඟ විඳ විඳ දෙහි ගහ හිටියෙ හොඳට අඳුරු වැටුණම තරු දිහා බලන්න හිතාගෙන. කොච්චර බැලුවත් එපා වෙන්නෙ නැති ගතියක් තරු පිරුණු අහසක තියෙනවා කියල එයා හිතුවා. ඒත් අද අත්තම්මාගෙ වචන මතක් වෙන සැරයක් සැරයක් ගානෙම හිතට දැනෙන බර හැඟීමත් එක්ක තරුවකටත් වඩා ඇවිළෙන ගින්නක් ඒ දරඳඩු හදවතේ තිබුණෙ. තරු එදා ආවෙ නෑ. ඒ වෙනුවට නිරිතදිග අහසෙ වට කළේ වැහි වලාකුළුයි. වැහි වලාකුළ හරිම අනුකම්පා විරහිත විදිහට වැහි බිංදු අහසින් තල්ලු කරන කොට ඒවා පොළොවට ඇවිත් වැටුණෙ වේදනාත්මක හඬක් සමඟින්මයි. ඒ වගේ වැහි බිඳුවක් දෙහි ගහේ කොළවලට කඩාගෙන වැටෙන කොට, අතු පහත් කරලා, කොළ නවලා, වැහි බිංදුව නලවලා, රිදෙන්නෙ නැති වෙන්න මහපොළොව මත තියන්න හිතුවක්කාර දෙහි ගහක් දරපු උත්සහය ඒ ඝන කළුවරේ කාටවත් පෙනුණෙ නෑ. ඒ වැස්ස තදයි. නෑ, ඇත්තටම කියනවන්ම් මුරණ්ඩු දෙහි ගහක කඳුළු වෙන් කරල අඳුනගන්න බැරි තරමට ඒ වැස්ස ධාරානිපාතයි.

වැහි බිංදුවලින් නැවිලා හිටිය දෙහි ගහ, ගැස්සිලා ඇහැරුණේ මී අඹ ගහ හුළඟත් එක්ක නට නට අතුවල කොළ නලවන සද්දෙයි ඒත් එක්කම ඇහුණු කිංකිණි සද්දෙකුයි එක්ක. ඉර එළිය යාන්තන් පෙරිලා එන අඹ අතු අතරින් ඉස්සි ඉස්සි දෙහි ගහ ඉර එළියට මූණ අල්ලන්න දඟලනවා. මොනව වුනත් ඉර එළියෙ උණුහුම විඳින්න දෙහි ගහත් ආසයි.

සුවී, අත් දෙකට පරණ බේසමකුත් අරගෙන ඉර එළිය වගේම කහ පාට ගවුමකුත් ඇඳගෙන මී අඹ ගහත් එක්ක ලොකු කතාවක්. ඒ හිනාව හිමිදිරිය තරම්ම නැවුම්.

ඉර එළිය හොය හොය ඉඳිද්දි එකපාරටම දෙහි ගහේ පැත්තක්ම උණුහුම් වෙන්න, කොහෙන්දෝ හිරු කිරණ වගයක් ඇවිත් කටු පිරුණු දෙහි ගහේ

හැප්පුනා. දෙහි ගහ හැරිලා බැලුවෙ මී අඹ අත්තක් පැත්තකට කරල අල්ලගෙන ඉන්න සුවී දිහා.

"මම මී අඹ ගහත් එක්ක කතා කරල ගිවිසුමකට ආවා. එයා කැමති වුණා මේ අතු ටික පොඩ්ඩක් කප්පාදු කරල ඔයාට ඉර එළිය ගන්න ඉඩ හදල දෙන්න." සුවී අඹ අත්ත අත්හැරලා දෙහි ගහ දිහාට ආවා. මේ වතාවේ අහක බලනවා වෙනුවට දෙහි ගහ බැලුවෙ සුවීගෙ අතේ තිබුණ බේසම දිහා. බලලා අනිත් අතට මූණත් පුළුටු කරගෙන අහක බලාගත්තෙ තාමත් සුවී එයාගෙ යාළුවෙක් නෙවෙයි ගානටයි.

"ඔහොම බලන්න එපා. මේ ගොමනෙ." සුවී ගොම පිරුණු බේසම බිමින් තියල දෙහි ගහ මුල ඇන තියාගත්තෙ මුල්ලුවකුත් අතට අරගෙනයි. වැස්සට තෙමුණු පස් නිසා වැඩි අමාරුවක් නැතුව සුවීට පුළුවන් වුණා දෙහි ගහ වටේටම පස් බුරුල් කරල ගොම පොහොර එකතු කරන්න. ගොමවලට රවල අහක බැලුවත් මොකද එක්කෙනෙක් එබී එබී බලබල හිටියෙ මුලු වෙලාවෙම සුවී මොකද කරන්නෙ කියල. කාලෙකින් වතුරවල පහස නොලබපු ඒ පස් තට්ටුව හරිම සනකම්. මුල්ලුවෙන් ඇන ඇන දෙහි ගහේ මුල්වල වදින්නෙත් නැති වෙන්න බොහොම අමාරුවෙන් තමා සුවී දෙහි ගහ වටේටම තිබුණු පස් බුරුල් කළේ. කොච්චර අමාරු වුණත් වැඩේ අත අරින ගතියක් නම් සුවීගෙ තිබුණෙ නෑ.

මේ සාත්තුව එදා හවසට විතරක් සීමා වුණෙත් නෑ. හැම දවසකම වගේ සුවී දෙහි ගහට වතුර දාන්නත් පොහොර දාන්නත් සාත්තු කරන්නත් අමතක කළේ නෑ. මෙහෙම සාත්තු නොකර අත්තම්ම මේ දෙහි ගහ උගුල්ලන්න කතා කරන එක කොච්චර වැරදිද කියල සුවී හිතුවෙ ඒකයි. හැම සාත්තුවකටම වඩා හවස් වරුවට අත්තම්මගෙ ලී බංකුව දෙහි ගහ යටට ඇදගෙන වාඩිවෙලා, නංගිලා දෙන්නවත් ලං කරගෙන, එයා කියවපු, අහපු කතන්දර මේ තුන්දෙනාටම ඇහෙන්න කියල දෙන එක සුවීගෙ දින චර්යාවෙ අනිවාර්ය අංගයක් වුණේ එයාටත් නොදැනිමයි. ඒක දෙහි ගහට කොයිතරම් බලපෑවද කියනවනම් කලින් හරිම දරුණුයි වගේ පෙනුණ දෙහි කටු දැන්නම් ඒ තරම් තියුණුවට පේන්නෙත් නෑ. නන්දිවිසාල ජාතකේ කියවෙන සුවදායී වචනවලින් සත්ත්ව මනසට වෙන බලපෑම ඇත්තටම සත්ත්ව මනසට විතරක් සීමා වෙනවද කියල සුවී හිතන්න ගත්තෙත් ඒ නිසයි. ඒකට හොඳම උදාහරණය තමා දෙහි ගහේ අග තියෙන අලුත්ම ලා දලු මිට. අනිත් හැම කොළේකට ම වඩා ලා පාටට ළපටි දලු දෙහි ගහේ අතු අග හිනාවෙවී හිටියෙ සුවීගෙ කරුණාවන්තකමට වෙන උදාහරණ එපා කියන්න වගෙයි.

ඒ හවස් වරුව වෙන හවස් වරුවලට වඩා වෙනස්. දෙහි ගහට අමාරුවෙන් අහස දිහා බලන්න ඕන වුණේ නෑ. අඹ ගහේ අතුවලින් වැහිල තිබුණු වලාකුළු

දැන් නිදහසේ දෙහි ගහට උඩින් පාවෙලා යනවා. අඹ ගහ දැන් ටිකක් ඈත් වෙලා තිබුණත් දෙහි ගහට අඹ ගහ ගැන දැනුණෙ කෘතවේදිබවක්. මේ නිදහස දැනුණෙ උඩු හුළඟටයි වලකුළුවලටයි විතරක් නෙවෙයි. දෙහි ගහේ මුල් අතර හුස්ම ගන්න පණු පැටව්, ගැඩවිල් පැටව් වගේම පස් අංශුවලම දැවටුණ වතුර බිංදු පවා කාලෙකට පස්සෙ මෙහෙම නිදහසේ හුස්ම ගත්තෙ.

අහස තැඹිලි පාට වෙනවත් එක්කම වතුර බාල්දියකුත් උස්සගෙන එන සුවී දිහා දෙහි ගහ බැලුවෙ මදහසක් නහාගෙනයි.

"අපි දෙන්න කොහොමහරි මේක කරන්න ඕනි. එහෙම නේද?" වතුර, ටිකෙන් ටික දෙහි ගහේ පා මුලට හලන ගමන් සුවී ඇහුවා. "මේ දෙහි වාරෙ ඉවර වෙන්න කලින් අපි බලමු ඔයාගෙන් මට දෙහි මලක් හම්බවෙයිද කියල." සුවී දෙහි ගහ දිහා බලලා කියනකොට දෙහි ගහත් හුළඟට වැනි වැනි අහන් හිටියා. වෙනදට වඩා සැහැල්ලුවකින් ඉන්න දෙහි ගහේ මේ වෙනස හුළඟටත් දැනිලා තිබුණා. ඒ නිසා බය නැතුව දෙහි ගහේ කොළ අතරින් දුව දුව සෙල්ලම් කරන්න තරම් හුළඟ නිර්භීත වෙලා තිබුණා. දෙහි ගහ අලුත් යාලුවෙක් ලැබුණු එකට අසතුටින් හිටියා කිව්වොත් ඒක බොරුවක්. සුවී වෙනුවෙන් පුංචි දෙහි මලක් පිපෙන්න දෙන්න දෙහි ගහටත් ලොකු වුවමනාවක් තිබුණා. සුවී එයාට විඳින්න දුන්න නිදහසට සරිලන්න එහෙමවත් කලගුණ සලකන්න ඕනි කියලයි දෙහි ගහ හිතුවේ.

වතුර දාල ඉවර වෙලා සුවී දෙහි ගහ ළඟ ඇන තියාගත්තෙ එයාගෙ සුපුරුදු අත් මුල්ලුව අතට අරගෙනයි. අද සුවී මොනව කරන්නද යන්නෙ කියල දෙහි ගහේ ළපටි දලු පුදුම වෙලා බලාගෙන හිටියා. එයගෙ ළඟ තිබුණු පොහොර උරයට අත දාපු සුවී එළියට ගත්තෙ පුංචි පොකුරු වද පැළයක්.

"අත්තම්මගෙ ආසවත් ඉෂ්ඨ කරන්න එපැයි නේද?" සුවී දෙහි ගහ දිහා බැලුවෙ කමක් නැද්ද අහන්න වගෙයි. දෙහි ගහ හිනාවෙලා හිස වැනුවෙ චූටි වද පැළේ පරිස්සමට බලාගන්න හිතින් හිතාගන්න ගමන්මයි. මී අඹ ගහත් මේ පුංචි වද පැළ දිහා ආසාවෙන් බලනවා දෙහි ගහ දැක්කා. එයත් සතුටින් හිටියෙ පොකුරු වදවලින් වත්තම එළිය වෙන එක ගැන.

සුවී ළඟ වද පැළ හතරක් තිබුණා. ඒවල මුල් අතර තිබුණු පස්වල තවමත් තෙතමනය රැඳිලා තිබුණෙ මේ දැන් පොළොවෙන් වෙන් කරපු බවට සාක්ෂි ලෙසයි. සුවී දෙහි ගහ ළඟම වලවල් හතරක් හදල වද පැළ ටික ඉන්දුවා. පරිස්සමට වතුර ටිකකුත් ඉස්සෙ වැඩි පරිස්සමටයි.

"ඔයා එයාලව බලාගන්නකෝ එහෙනම්. මම හෙට උදේ එන්නම්" සුවී හති දදා නැඟිට්ටෙ මහන්සියෙන්මයි. වෙනදට සුවී එක්ක දොඩමලු වෙන්නම හදන දෙහි ගහ අද සුවී නැඟිටල යනවවත් දැක්කෙ නෑ. එයා බලාගෙන හිටියෙ මේ දැන් පොළොවත් එක්ක නැවත සම්බන්ධ වුණු අලුත් වද පැළ දිහා.

බැහැගෙන යන ඉර රශ්මිය වද පැළවලට නොවැටෙන්න දෙහි අතුවලින් මුවා කරගත්තු දෙහි ගහ තවත් උවමනාවෙන් බැලුවෙ එක වද පැළයක තිබුණු එක රතු පාට වද මලක් දිහායි. ලා රතු පාටින් පටන් ගත්තට පෙති අගට එනකොට තද රතු පාටක් වෙලා තිබුණු වද මල දිහා දෙහි ගහ බලාගෙන හිටියෙ රතු පාටින් බැහැගෙන යන ඉරටත් වඩා ප්‍රාණයක් ඒ මල ඇතුළෙ තියෙන විදිහ ගැන පුදුම වෙමිනුයි.

“අත්තම්මේ...............අත්තම්මේ........”

“මොකද ළමයො බෙරිහන් දෙන්නේ?” උදේම තේ හදන්න වතුර ලිපේ තියල ලිප පත්තු කර කර හිටිය අත්තම්ම, සුවීගෙ තිගැස්සුණ හඬට පොඩ්ඩක්වත් කලබල නොවී ඇහුවා.

“මෙහෙ එන්නකො අනේ” සුවී කලබලේ වචන කරන්නෙ නැතුවම අත්තම්මව අතින් ඇදගෙන මිදුලට එක්කගෙන ආවා. ගේට්ටුව ළඟ දලු දාපු දෙහි ගහත් අලුතින් හිටවපු වද පාත්තියත් සුවීගේ ප්‍රියතම ගෙවතු කොටස කියල අත්තම්මා දන්නවා.

දෙහි ගහ ළඟට ආපු සුවී පරිස්සමට අලුතින් දලු දාපු දෙහි අත්තක් උස්සල අත්තම්මට පෙන්නුවා. අත්තම්මත් බෙල්ල පාත් කරලා හොඳට නිරීක්ෂණය කළා. දෙහි අත්ත අග ළපටි දලු දෙකකට මැදි වෙලා තිබුණෙ තවම සම්පූර්ණයෙන් පිපුණෙ නැති සුදු පාට දෙහි මලක්. ළා දලුවල පාට අතරින් මේ පිරිසිඳු සුදු පාට කැපී පෙණුනා. දෙහි ගහ බිම බලාගෙන හිනා වෙවී හිටියෙ ලැජ්ජාවකිනුයි ආඩම්බරයකිනුයි සතුටට පත් වෙලයි.

“මමත් අදයි දැක්කෙ. බලන්නකො, මම කියන දේ අහල දෙහි ගහ මෙහෙම්මම තියපු එක හොඳ නැද්ද?” සුවී හිනාවෙවී අත්තම්මගෙන් ඇහුවෙ එයාටත් මේ දෙහි මලේ පුංචි අයිතියක් තියෙනව කියල හිතලයි.

“ඒක නම් ඇත්ත තමා.....මම මේ බැලුවෙ..” අත්තම්ම අවිනිශ්චිතව කිව්වා.

“ඇයි මොකක්ද ප්‍රශ්නෙ?” සුවී කලබලෙන් ඇහුවා.

“ මේක දෙහි ගහක් නෙවෙයි වගේ. සුවී, මේක දොඩම් ගහක්.” අත්තම්මා පුදුම වුණා. මෙච්චර කාලයක් කටු රෙද්දක් පොරොවගෙන හිටිය මුරණ්ඩු දෙහි ගහ ඇත්තටම කෑමට එක්කරන ඇඹුලක් නෙවෙයි සම්පූර්ණයෙන් ම, ප්‍රණීත ආහාරයක්.

එදායින් පස්සෙ සුවී, දෙහි ගහට... ආහ් නෑ...... දොඩම් ගහට සලකන සැලකිල්ල තවත් වැඩිවුණා වගේම දොඩම් ගහත් තව තවත් සතුටින් ජීවත් වෙන්න ගත්තා. අලුතින් ආපු අතු හැම එකක් ම දොඩම් මල්වලින් වැහිල යන්න වැඩි කාලයක් ගියෙ නෑ. සුවීගේ සුදු පාට දත් දෙපෙළ තරම්ම සුදු පාට

වුණු මේ මල් පේළිය පෙනුණෙ දොඩම් ගහේ පිපුණු මදහසක් වගේ. ඒ හැම මලක් ම කැප වෙලා තිබුණෙ සුවීගෙ නමින් කිව්වොත් ඒකෙත් වැරද්දක් නැතුව ඇති.

හැමදාම පිනි බිංදු එක්ක ඇහැරුණු දොඩම් මල් කහපාට රේණුවලින් හැඩවෙලා තිබුණෙ මේ මල් පූදින්න උදවු කරපු ඉරට උපහාරයක් විදිහටයි. සුවී දිහා බලන්නත් අකමැති වුණ දොඩම් ගහ දැන්නම් සුවී දිහාම බලාගෙන හදවතින්ම හිනාවෙන්නෙ එයාගෙ අතු අග තියෙන කුලුදුල් දොඩම් ගෙඩිය අතේ තියාගෙන ලෝබකමින් වගේ කඩන්නෙ නැතුව ඉන්න සුවීව දිරිමත් කරන්න හිතාගෙනයි.

සුවී රළු පොත්ත දිගේ අත අරන් ගියේ ගෙඩිය ගහෙන් වෙන් කරන්න ලෝබ කමින් වුණත් එයාට මේ ගෙඩියෙ රස බලන්නම ඕනි නිසා ඒතරම් තදින් නොවුණත් ගෙඩිය ගහෙන් වෙන් වෙන්න ඇදල ගන්න සුවීට පුළුවන් වුණා. ඒක රිදුණා, ඔව් දොඩම් ගහට සැහෙන්න රිදුණා. ගෙඩිය ගහෙන් වෙන් වෙන කොට එයාගෙ හදවත ඉරෙන සද්දෙ දොඩම් ගහටම ඇහුණා වුණත් සුවී කාර්යබහුල වෙලා හිටියෙ දොඩම් ලෙල්ල ඉවත් කරල දොඩම් බිකක් ගලවගන්න දරපු උත්සහයත් එක්ක. ඒත් දොඩම් ගහ වැඩියෙ වේදනාව පෙන්නන්න ගියෙ නැත්තෙ සුවීගෙ මූණෙ තිබුණු හිනාව නිසාමයි. ඒ දොඩම් ගෙඩියෙ සංචිත වෙලා තියෙන්නෙ සුවී දීපු ආදරේමයි කියල දන්නෙ දොඩම් ගහ විතරමයි. ඒ නිසයි එයා නිහඬවම සුවී දොඩම් බිකක් කටට ඔබාගන්න දිහා බලාගෙන තනියම හිනාවුණේ. අන්තිමේදි සුවීට කළගුණ සලකන්න ලැබුණ එක ගැන දොඩම් ගහ හිටියෙ ඉහ වහා ගිය සතුටින්. ඒත් ඒ සතුට වැඩි වෙලාවක් පැවතුනේ නෑ.

ආසාවෙන් දොඩම් බික කටට ඔබා ගත්තට සුවී අනිත් පැත්තට මූණ ඇඹුල් කරගෙන කටේ තිබුණු හපපු දොඩම් කැලි තූ තූ ගගා එළියට විසි කළා. සුවී ඇදවෙච්ච මූණෙන්ම ඉතුරු දොඩම් බික් ටික දිහා බැලුවා. සුවීගෙ සද්දෙ ඇහිල අත්තම්ම කලබල වෙලා දොඩම් ගහ ළඟට දුවගෙන ආවත් දොඩම් ගහ කොයි තරම් කම්පනයකින්ද හිටියෙ කියල එයා දැක්කෙ නෑ.

“මොකද ළමයො වෙලා තියෙන්නෙ. මෙතනම කඩා ගෙන කෑවද? කෝ බලන්න” අත්තම්මා අත දික් කළාම සුවී කිසිම හැඟීමක් නැතුව දොඩම් ගෙඩිය අත්තම්මගෙ අතට අත හැරියා. “පැණි දොඩම්ද?”

“නෑ..ඇඹුල් දොඩම්.” සුවී අප්‍රසන්න විදියට උත්තර දුන්නා. “මමත් හිතුවෙ පැණි දොඩම් කියල. ඒ නිසයි මෙච්චර මැරි මැරි සාත්තු කළේ. මහ කමකට නැති ගහක්. මුලදිම උගුල්ලල දාන්නයි තිබුණෙ.”

“එහෙම කියන්න එපා සුවී. ඇඹුල් දොඩම් නම් කොච්චර හොඳද? බෙහෙතටත් ගන්නවනෙ.” අත්තම්මා ඉතුරු දොඩම් ගෙඩිය අත්ල මත පෙරළමින් ඇහුවා.

“මම ඇඹුල් ජාතිවලට කොච්චර අකමැතිද කියල අත්තම්ම දන්නවනෙ. මට නම් අප්පිරිය හිතුණා.” සුවී අතින් දිව පිහදමමින් කිව්වා.

“මම ඔයාට මේකෙන් බීම එකක් හදල දෙන්නම්. සීනි ටිකක් එහෙම දැම්මම හොඳට තියේවි.... සුවී!!” අත්තම්මා කලබල වෙලා කෑගැහුවෙ අත් දෙකෙන්ම කටු පිරුණු දොඩම් ගහ බදාගෙන හිටිය සුවී දිහා බලාගෙනයි. ස්තූති කරන්නද? නෑ. දොඩම් ගහේ කටු හුඟක් තියුණුවට තිබ්බ කියල අත්තම්මට මතක තිබ්බ. ඒ වුණාට සුවී, අත් දෙකේ උපරිම හයිය අරගෙන දොඩම් ගහ පොළොවෙන් උදුරල දානකොට එයාගෙ අත් තුවාල නොවුණෙ කොහොමද කියල අත්තම්මට හිතා ගන්න බැරි වුණා. දොඩම් ගහේ මූල පද්ධතිය වේදනාත්මක හඬක් නඟමින් පොළොවෙ අන්තිම පස් පිඬත් අත් හැරිය විදියවත් ප්‍රාණ නිරුද්ධ වුණු දොඩම් ගහේ මෘත දේහය පොළොවට වැටෙන කොට ඇහුණු බොල් ශබ්දයටවත් සුවී කලබල වුණ බවක් පෙන්න තිබුණෙ නෑ. දොඩම් ගහ කලින් තිබුණු තැන මතුවෙලා තිබුණු නැවුම් පස් හිතුවෙ වේලුණු පස් තිබුණනම් මීට වඩා තදින් දොඩම් ගහ අල්ලගෙන ඉන්න තිබුණා කියල විතරයි.

“මේක හරියන්නෙ නෑ අත්තම්මේ. අපි තව වද පැළ ටිකක් දාමු.” සුවී හිස් බිම දිහා බලාගෙන කිව්වා. අත්තම්මා මුකුත් නොකියා ඔලුව වනමින් ඉතුරු වුණ ඇඹුල් දොඩම් ගෙඩිය දිහා බැලුවා.

අන්තිම මොහොතෙ දොඩම් ගහ ආදරෙන් වද පැළ දිහා බලල හිනා වුණ විදිය මී අඹ ගහ විතරක්ම දැක්කෙ ඒ නිසයි.

## ***06 The Iron Heart***

(The heart above the neck)

It’s amazing how
A fragile blossom
Face the sun
With no fear
Of being burned
While we,
Tough humans,
Rulers of the land,
Prefer an umbrella
Above our brains

## *07 කවි හදවත*

( හුස්ම අල්ලන්නෙත් එළිසමය ගැළපෙන්න.
සුසුම් හෙලන්නෙත් විරිත නොකැඩෙන්න.)

ලොව දෙස නෙත් අගින් බලමි.
දූවිලි වලා ඇතිරුණු මහ මග ද
තුරුලතා නිලනා ගම්බද ද
අහස් කුස සරනා වලා ද
සොබාදහමේ සැම කොනක ම
මගේ සිත පැටලෙන බව දැක
ගැඹුරු හුස්මක් ගනිමි
ගත් හුස්ම රඳවා ගනිමි
අත් නොහරිමි
පසු නොබලා දුවමි
පැන්සලක්, කොළයක්
මුණගැසෙන තුරු
මෙතෙක් අල්ලාගෙන සිටි
හදවතේ තෙරපුණු හුස්ම
කොළය මත අත් හරිමි
සුසුමක් නොව සැනසුමක් ලෙස
ඒ මගේම, හුස්ම වන බවට
පිටුව මත ඇඳි කාබන් පහරවල්
සාක්ෂි දරනු ඇත.
ඔබ එයට “කවියක්” යැයි කීවාට
මට කරන්නට දෙයක් නැත.

## ***08 මියුරු හදවත*** ( නැට්ටුවෙක් ඉස්සරහ අසරණ වෙච්ච හදවතක්)

තාල තබනා දෙපය නොදැනිම - සිනිඳු වැලි බිම, වෙත දිවෙන විට

උච්ච ස්වර ගයනා දෙතොල් අග- සිනා කැන්දන මහා සමුදුර

තාල තබමින් වාද නගමින් - ගයන විට ඒ මහා ගීතය

රැය පහන් කර දවස ගතකර- එහෙත් අවසන් නොවන පදවැල

උණුහුමට වැලි මත අසුන්ගෙන- ඔබේ ඔපෙරා අසා සිටියෙමි.

"කිමද අරුමය ගයන මනහර - කිසිදා විඩා නොදැනීද ඔබහට?"

නීල දෙනුවන ඔබේ මවෙතට - හෙලා දුක්බර සිනා පෙණ පිඬු

හමන සුළඟට ඇඟිලි දිගු කර- වේදනාවෙන් ගැයුව පදවැල

මා අසා සිටි හොඳම ගී පද!

"පවන මා දිවි කලඹනා විට,

මවෙත ගැටෙමින් රුදුරු අයුරින්

පහරදෙන විට සාහසික ලෙස

එයට එරෙහිව අහස වෙත මා

නැගෙන්නට අරගල කරන හඬ

ඔබට ඇසුණිද ගීතයක් ලෙස?"

දැන සිටිමි අරගල හඬක් බව- මගේ ගායන සමඟ සැසඳෙන

ඒ නිසයි අගයන්නෙ මේ ලෙස <3

මගේ දිවියට සයුර ඔබෙ හඬ- හුදෙක් තේමා ගීතයක්ම ය.

## ***09 නිමල හදවත***

( නොමළ නම් තවත් හොඳය. )

කොළඹ මහ පාරේ

දහවල් කට්ට අව්වේ

හෝන් හඬ මැද්දේ

දැනෙන නොදැනෙන සේ

මදනලක සේයාවක් විත්

මුව වැළඳගත් විට

දාඩිය දුගඳ පරදා

නාස්පුඩු තුළට ගැලුවේ

ලඬු සුවඳක් නොවෙද?

සිංහ ලේ දෙමළ ලේ

නොවන එකසේ

ගලන රුධිරේ

වේ සහජීවනේ

කෙතරම් සොඳුරුයිද

එකම උයනක

පිපී හිනැහෙන

ඉද්ද , වතුසුදු

රෝස , එරබදු

මල් ගොඩක් සේ

සුවඳ දෙන විට.

# The Untamed heart

## ***10 The Untamed heart***

(Not planning to tame either)

Rain drops always fall. Just like now. Just as I'm looking through this mist coated shuttle of the car, they fall from the sky endlessly. It's either clouds are laden with water, so they throw the leftovers to the earth, or the raindrops are done with the clouds that they are jumping from the sky, expecting freedom to be on earth.

It's empathetic to think that the little raindrops won't find the freedom they search here on earth. Because humans rule the land, and the nature must bow at their knees? No. It's because the freedom is supposed to be earned here in a different method.

Even if you are so rich that you can eat million types of dishes for a single meal, it is possible that you have tasted no amount of freedom in your entire lifetime.

Even if you have claws and teeth as sharp as blades, it is possible that you can never roam around the world freely on your own.

Those two examples are right here on the back seat of this SUV.

The car is speeding through the rain. There are not many vehicles on the road. We will be at the zoo in no time. I put my cheek against the shuttle and looked up. Clouds are partly parted, and light is on its way to earth. I wish this rain would be over before we get out. Because Madi hates rain.

She is sleeping on the backseat right next to me. Her long body is sprawled next to me, but her head is on my lap. Mouth open, snoring like a kitty cat and drooling all over my new 'We love animals' t-shirt and brown cargo pants. She has gotten bigger. So big that her head feels a little heavy to my lap. She must be the only domestic lioness in this island so far. No, Madi is not my pet. She is my friend. Even if the communities of animal lovers don't get it.

I still remember my sixth birthday. That's when I got a new best friend. Madi was just a cub back then. More like a cat. And I thought she was a cat.

"Happy Birthday, Daddy's princess. I brought you a cute kitten." He handed me a cardboard box with few holes on the top which I clutched with my chubby hands. Something moved inside.

"Do you really think that this is a good idea?" I heard mom asking Dad in a low voice.

"Why not?" Dad asked back just as I opened the box to find a golden color kitten blinking at me with unbelievably cute black eyes.

"Because, you know…. It's not legal to keep a lioness. It's not safe for us either."

"It's still a cub. Let's see what we can do when it grew up."

Those eyes were pools of feelings, and I instantly felt connected with her. She seemed a little lonely in that box only with a piece of cloth to accompany her. So, I scooped her up into my arms. I locked my eyes with that endless cuteness.

"Ama? Or Madi?" I asked without looking up.

"What sweetie?" Mom asked putting a comma to their conversation for a bit.

"Which name should I give her?" I looked at my parents and that look on my face put a full stop to the conversation they were carrying on.

Now that we are connected, there is no way to separate us. It was the flat truth that they understood at that moment.

"We are here, Miss Eva." Just as the driver brought me back to earth, I turned to see the gates of the zoo rising in front of us.

"Come on Madi." I patted my friend dearly. After waking her up, I got out of the car to enter the premises. Madi lazily got out and stretched and yawned. Showing off her pointy teeth. A bunch of kids were passing by, and they got scared by Madi's little show.

The rain has almost stopped. Madi's golden body and unmistakable carnivorous characteristics are highlighted to everyone entering the zoo.

"Miss, I would be in the car park. Call me if needed." Middle aged man who worked as my driver told me just before he disappeared into the traffic.

I knelt in front of Madi and stroked the golden furs gently. She pushed her head into my palm happily.

"Madi, listen, we are just going to see how it's like in there. It's not decided yet. No matter what Dad says, if you don't like it, I won't put you in there. Let's just think that we are having one of those walks that we take at fine afternoons, and we can enjoy ourselves." I don't know whom I assured. Her? Or me?

I rose and entered the zoo. Madi is a step behind me, following me like a good kitty. People stare but I don't care. This could be the final walk I'm going to have with my best friend so I can't afford to lose the value of it because of some strangers.

A nice-looking boy runs towards us. He is wearing a green color t-shirt, and his name tag says "Savinda". Must be an employee in the zoo.

"Good morning, you must be Miss Eva. I recognized her." He eyed Madi, who was currently busy searching around for ice-cream. She knows where there is a crowd of people, there is always ice-cream. I offered the boy a polite smile which turned upside down from his next words to Madi. "As you are going to stay with us now, it's good to observe everything around." He said to observing Madi. "Come with me". He leads the way through the crowd. I followed him with Madi.

I didn't expect the zoo to be this much crowded as it was raining heavily in the morning. But it was crowded so I tried not to lose Madi in the crowd. It wasn't much of a problem as people parted at the sight of a grown lioness roaming freely.

People were gathered to watch birds. They were at the front of the zoo making a morning show. I didn't wait to watch. I just took Madi out of the crowd and stepped behind the zoo boy.

I am severely against caging animals. They are supposed to be free. I wish I can cage all the humans, who want to put animals in cages so they can observe animals at their free times. At least they would know what it is like to be caged.

"Madi is not going to stay here. We are just checking the situation if it comes down to no options." I informed the boy while trying to walk parallel to him.

"I heard that a person was bitten. You still think to keep her with you. You could be the next one." Did he warn me about my best friend biting me?

"It was an accident. That girl pushed me, so Madi got angry. Is it her fault that she defended her best friend?" I said partly looking at my kitty who was excited about the green surroundings.

"I don't know, Miss. Carnivorous creatures are just what they are. Eventually they are just animals." The zoo boy tried to defend his side.

"Aren't we all?" I asked lowly just as we reached the board said 'Lions'.

It wasn't a cage it was a pit too deep that lions in it can't climb. In an area about a school ground, they roamed freely. There is a fountain and few trees along with rocks where lions were resting. That's the reason I choose this place. It doesn't cage the king of the jungle. At least my queen will be free to walk around. Not that I am going to leave her.

"There are five lions and three lionesses. She won't feel lonely. We feed them twice a day. Bathe them once a week." The boy explained. I peeked from the railing at the end of the pit. They don't look bad. But Madi looks cozier than them. But they look healthy.

“There are new cubs in our reproduction center. Do you want to see them?” He asked.

“Yes, Of course, I love lion cubs. Come, Madi” I turned to go but the zoo boy stopped me.

“I was advised to bring you there. Not her.”

“Wherever I go. She goes.” I said flatly.

“Why don’t you leave her with her own kind. She will enjoy it too.” Someone behind me spoke. I turned to find a middle-aged man with a huge beard. He was wearing a t-shirt like the boy’s t-shirt.

“This is Joseph, Our lion caretaker.” The boy introduced him when Joseph treated me with a kind smile.

“You must be Eva. Your father talked to the boss and arranged everything. You just have to hand over the lioness. Is that her?” He questioned looking at Madi who was peeking through the glass of a toy shop. There were stuffed animals to be bought. I’ll have to buy one of those for her. But wait, what did he just say? Hand over? Not in this lifetime.

“We are still talking about Madi’s situation. I didn’t come to an agreement with my father. He made me promise to search the place and check whether it is okay with Madi. That’s what I am doing.” I answered carefully. I didn’t want them to be aware of the court order.

“So, is it okay with her?” Older man asked.

“I don’t know yet. It’s Madi’s decision. We need to discuss before making serious decisions.” I see the boy smiling at my words like I am a joke.

“Why don’t you leave her here for an hour. Among her peers. She will be fine. Don’t worry.” That’s exactly what I am worried about. What if Madi was completely fine without me. What if that was the life she wanted to have when she was taken away from her family to be my birthday present. What if she never wanted

me from the beginning. So many what ifs ran around my head while I was watching two lionesses playing with each other.

I am afraid of losing her. But I am more afraid of her losing herself.

“Okay, fine. But, one hour. Only one. Then I take her and go home. No more discussions.” I put my hands in the air and stop his objections. “Madi, come here baby.”

She suddenly snapped her head at my voice calling her name and ran to me like a kitty. She cuddled around my feet making me to clutch the railing for the balance. And they expect me to leave her. How unfair.

“It’s okay kitty. You are going to have some new friends. I’ll be gone for an hour and if you needed me, I’m right outside the pit. After this annoying arrangement we’ll go to Rio for ice-cream.” I nodded at the lion caretaker. He takes a circle like thing and put it to Madi’s neck. She got nervous and snarled at the older man.

“It’s okay Madi. He is a friend.” She calmed down at my voice, but I can feel my own voice breaking when that ring tightly hold on to her neck. The older man pulled her backward to go to the entrance of the pit where the lions were. I was totally helpless when Madi was being dragged stumbling as she tried to get a glimpse of her best friend. Her big cat eyes were focused on my tear-stained cheeks. Those big eyes were so cute and helpless at the same time. I just wanted to scoop her up to my arms and run.

I was urged to meet those animal lover communities and show them how this can be the freedom to an animal who was supposed to be in the jungle instead of a house. I wanted the court to see what it’s like to be parted from the only person you ever loved, because you walked on four legs instead of two. I know it’s not permanent. Madi will be with me within an hour. But, one day it’ll be permanent. So, I let my tears fall as she was dragged away from me.

I have no idea why they did this. I’ve never been away from Eva. She has never left me alone. But, when this man put a ring to my neck and pulled me she didn’t do anything. As I can recall I didn’t misbehave recently. Maybe she has found that I ate her breakfast egg. She doesn’t even like eggs. Or maybe she is angry with me for licking her hair just after she bathed. It’s not my fault that her shampoo tastes like strawberries.

Could it be that girl’s incident? That evil girl pushed my Eva. She fell and hurt her knee. The injury looked like a crushed cherry food. How am I supposed to ignore her tears that fell after she saw blood on her knee. I couldn’t stop myself. Okay, I could. But I decided not to. I jumped towards that evil girl and bit her hand. The injury wasn’t as terrible as her screaming. It was deafening. According to Eva, she just ‘overreacted’ and she is just ‘A drama queen’. I have no idea what that means. But I hope it’s a terrible insult.

This man pulled me to an iron gate which was locked. A small tunnel was beyond that. Eva is nowhere to be seen. He pulled a set of keys from the back of his pocket, holding the stick of this ring from his other hand. It looks like he is having trouble choosing the right key. He stumbled with few keys.

“You should call Eva. She can pick any lock. She often picked locks when her parents locked her in her room as a punishment.” I tried to say but he misunderstood me.

“Oh easy, Kitten.” He looked at me with a little bit something like fear at the edges of his eyes. I tried to help. These humans can’t even understand a simple sentence. All just get scared. All except Eva. She is really good at communicating.

We often talk for hours after school. She reads to me or tells me about her school. I tell her about the butterflies at the back of the garden. School sounds boring but I always try to pay attention when she talks about that, because I love the tone of her voice

when she tells the funny stuffs they did in school. She sounds so happy at those times.

The man has found the key. Finally…….

He took that ring off me and pushed me pass the iron gate. It's annoying that he makes stupid noises while ushering me in. I just turned and walked in like a prideful kitty. I know how to do the catwalk. Eva practices it all the time. We usually do it together. I am even better than her. I wanted to be confident with whatever waiting for me on the other side of this small tunnel.

I walked into the open area that appeared at the end of the tunnel. Tall walls covered the entire area. More like the football ground we recently went.

The ground looks a little rough. I walked searching for something. To be honest, I was searching for my Eva. Where is this girl? I tried the air. It doesn't smell like her. It's easy to identify her scent. She uses this expensive soap that smells like rose flowers. Sometimes, she uses that soap to bath me too. Then we both smell the same. Then we will both be wrapped in white bath towels and watching new movies. Ice-cream will often accompany us.

I suddenly saw her. At the edge of the pit. Leaning against the railing. Waving the hand at me frantically. This stupid girl! She is so careless that she can fall from the railing if she jumps that frantically. I must get there. I walk toward her from the ground.

"Hey, new girl" I turn toward the sound. Two kitties like me. Two more male cats. They are staring at me.

"Are you going to stay with us?" One golden kitty with excited eyes asked me. I walked toward them. I've never talked with anyone except Eva. This feels weird. Okay, I shouldn't show that. Act normal !

"She smells odd." One male cat with lots of golden furs around his head murmured. 'I smell like roses' I wanted to say. But I stayed silent.

“Are you hungry? They didn’t yet give us food. It will be soon” A kind lioness said.

“I ate breakfast at home” I finally made a sentence.

“Home?” A lion questioned.

“Yeah, Eva and I ate breakfast while watching a movie. It was a very scary movie with zombies invading the earth.” I said while they were watching me with surprised eyes.

“Wait, are you a pet lioness?” An old lion appeared from behind and asked.

“I am not a pet. Eva is my best friend. She...” I tried to justify but I was interrupted.

“Does she give you her meat to eat?” A lioness questioned greedily. I trembled at her words.

“What…...? No…She gives me steaked meat or mostly KFC. We both eat that together.” I suddenly wanted to get out.

A metal sound came, and all the lions and lionesses looked up excitedly. A basket was lowered from the edge of the railing by the man who guided me here. I turned to see Eva, but she wasn’t there anymore.

The basket was full of meat. Blood was dripping and I wanted to vomit. It wasn’t even crispy. My fellows flipped the basket and dropped all the bloody meat to the ground. As the fresh blood flew on the ground lions and lionesses gathered around restlessly. They stripped meat with their sharp nails and teeth. Then chewed and swallowed. I watched terrified. Blood was covering their golden furs gradually. I was breathing heavily when an old lioness turned to me.

“Come here girl. Once you taste fresh blood dripping meat, you will no longer be a fan of cooked meat.” She encouraged me.

I neared the pile of meat. Most is already over. But there was still fresh meat enough for me. I touched the meat with my paw and it’s so soft. I lowered my head and smelled deeply. Indeed fresh.

I licked it slowly. I don't know what happened next, but I was digging into the meat that tasted like nothing else I've tasted so far. The older lioness was correct. Not only I won't be a fan of cooked meat anymore but also, I won't be able to stand still at the sight of fresh blood.

I couldn't be patient for an hour. While I was watching the little lion cubs, all I could remember was my cub. So, I ran back to Madi in less than thirty minutes. I was waiting at the toy shop for the lion caretaker to bring my kitty back. I bought a stuffed bunny for Madi and a stuffed lion for me. People were gradually coming to the zoo now. But I can see the traces of rain in the sky. I want to get out of here now. I definitely don't want to be back.

I've come to a decision about Madi. There are good friends for her. They take care of animals very well. They are well fed and treated. She will also have friends. Not a fragile human like me, but real friends, who have sharp claws and pointy teeth just like her. She will lead a contented life here with fellow lions. So, I'm going to cry and cry until father lets me keep her at home. Or I'm going to move to a different country where keeping lions isn't prohibited.

It's true that Madi will have all those lucky chances if she came to the zoo. But on the other hand, I'll have nothing. I'll be left alone to die on my own. I can't endure that and be brave and generous enough to leave her at zoo. But It's my own opinion. We'll have to discuss about that too. If Madi insists on coming I won't tell anything against her choice.

"Miss Eva?" A panicked voice sounded from behind. I turned with stuffed animals on my palms. They fell from my hands the moment I saw Madi.

She was a mess of blood and pieces of meat. I couldn't stand still. Her golden furs were dripping blood. When she opened her mouth, I registered crimson red teeth and tongue. I knelt in front of her and urgently scooped her to my hands.

“Is... Is she hurt? What happened? Did those naughty lions hurt you? Oh…...my poor cub”

She didn’t look hurt though. When I tried to smooth her bloody furs, she sniffed oddly.

“She isn’t hurt. But I advise you to stop keeping her at home. It’s a carnivorous animal and it won’t be satisfied with your cookies. Specially not when it has tasted a real meal.” The older man said while releasing Madi from that ring like thing.

“……”

“They are just animals who aim for the survival.” He said furthermore.

“Thank you for today. I’ll let you know what the final decision is.” I dragged Madi from furs and headed toward the exit. While all the people were staring at us, we got out of that purgatory.

We both were silent for a while. I headed to the parking lot with Madi trailing behind me. She could hardly walk stably. Due to the dizziness or whatever aftereffects after eating a large amount of fresh meat, she was swinging from side to side. My head was a circus, and I just paid attention to get us to the car. The parking was clearly full. I walked along a random row of vehicles trying to find the familiar black SUV. My driver uncle wouldn’t be expecting me this earlier. Not even two hours has passed.

There weren’t many people in the parking area. Suddenly few raindrops fell from the sky. I looked up to see a black cloud dominating the sky. It’ll take only minutes to turn this into a storm. I hurried through the vehicles despite everything else, keeping tabs of Madi.

Just as I was turning from a corner, I saw them. Six men wearing black outfits. They were discussing something near an open van. The only person I recognized is the person at the front. The driver I came with. My instincts took control of me and I hid behind a rusty color car dragging Madi along with me. She was confused but, didn’t make any sound.

“I told the girl to call me when She come to the parking. Maybe she will be a little bit late. When the sound of the rain fill the atmosphere, it’ll be easier for us.” I trembled at the driver’s words. He was newly hired and from the few words I exchanged with him I understood that he was fascinated about the amount of money my father earned. I didn’t notice that he was this much fascinated.

“You have to take care of the girl.” He instructed a man with a beard. “The rest of you take the lion. It’s not as ferocious as an untamed lion but careful. Tamed or not It’s still a lion. Make them both unconscious but at any cost don’t hurt the girl. We only need money, not her father’s wrath to follow us for the rest of our lives.” I started to think about a way out of this. If I start to run, they’ll notice. The light rain is starting too. But I have the element of surprise. They have no idea that I am here. And they definitely don’t expect me to attack my kidnappers. With a lioness who suddenly looks like an untamed beast. No matter what, My beast.

“What do we do to the lioness? We can’t keep it in the warehouse where we planned to keep the girl.” One of the men asked the driver who played the role of the leader.

“Of course we can’t keep it. We have to kill it and bury the body before it become conscious.” I was ready to attack with Madi but suddenly I stopped and leaned against the body of the nearby car. What if anything goes wrong and they hurt my best friend? Today when I saw her dipping blood I got so scared that I didn’t even remember to bring those stuffed animals with me. I have the gut to fight. But Madi isn’t in the normal condition. I was planning to visit her doctor on the way home. She looked half doped. I can’t expect her to do an entire battle for me when she isn’t feeling well. Specially not when her life is on the table.

I took Madi’s head to my palms and stare into those deep black eyes. “No matter what direction the wind howls I’ll always be with you.” I whispered to her.

“Miss Eva?” I jumped at the sound of my driver at my side. It took him less than a second to figure out what has happened. Before

he opened his mouth to call others I turned and ran through the parking lot dragging Madi along with me.

She is a good runner. Even after eating such a foreign meal, she ran so fast but never passing me. I don't blame those people who screamed at the sight of Madi. She was a carnivore dripping blood from the corners of her mouth and following me like she is hunting me. And I was running like a prey trying to escape from a carnivore.

We didn't slow down even as we entered the town. The houses and roads were packed in this city and the rain was getting heavy. I noticed from the corner of my eye the black suited men following us from few meters behind. I wanted to get to a safe place to make a phone call to my dad. I could have gone to a shop or to a police station. But I didn't trust anyone to guarantee Madi's safety.

I crashed with a random person while running and looking behind. I fell face flat on the street. The blood started to bloom from my knees and elbows. Madi suddenly roared to the stranger which made him more scared. I got up and dragged Madi away from the terrified man.

As there weren't many people on streets with the rain, we ran across the street and turned to an even less crowded lane. There were numerous sub lanes. This is the chance to get rid of those kidnappers. They haven't crossed the road yet. I ran faster.

Just as I was out of their eyesight, I turned to one of those sub lanes. It was a narrow lane with piles of garbage as big as mini buildings. I lead Madi through the garbage piles covering my nose from my elbow. Madi hesitated at the scent.

"Come on, Madi. We are going to hide here behind this pile of garbage until they are gone." She followed me with a disgusting expression on her face.

I knelt behind a pile of garbage. Madi was behind me. She was observing a shattered doll. We were completely covered from garbage. Despite the scent I felt safe. I could hear few footsteps,

and I saw those men running along the street. They weren't even trying to search around. They just ran ahead.

I let go of a heavy breath I was holding for a while. The rain was so heavy now I was a wet mess. I searched my pocket for my phone. The display was shattered. I got scared whether it won't work. But, Luckily the wallpaper came to light after a few shakings. I dialed my father's number.

Being rich has never been easy. I informed him about what happened with the driver and the kidnappers. He asked me to share my location which I did without farther delays. He promised to be here within minutes. Even though he asked me to move somewhere safer. Somewhere crowded. I rejected it saying I didn't want Madi to be hurt by any means. Physically, mentally or even emotionally.

"Be careful. That's all I want from you. I am already halfway there. Stay on the line. Keep talking to me." He was in a vehicle. I hear the sounds.

"I am okay, Dad. I can take care of us. You are not to worry. Have you told mom? She will…." Suddenly Madi made some crashing noises. I turned and put my finger to the lips. But the sight in front of me left me speechless. Madi was looking at me with an unknown look in her eyes and a mouse between her teeth. The mouse was alive, but it was struggling for its life desperately. Thick blood was dripping from Madi's teeth.

"Sweetheart? Eva? What happened? I can hear you breathing heavily. What's wrong?" None of his words were understood by my brain. I searched the street thinking whether anyone has heard Madi's noises. Only the rain and a passing passenger occasionally.

"Eva?" My father's panicked voice rang through me.

"Fine. I... I am… fine." No, I am not. I am so angry at those people in zoo who made my innocent Madi into a carnivore.

“She was a carnivore from the beginning.” A little voice at a deep corner of my mind talked to me. I was looking ahead of me when I felt a hot wetness at my elbow.

I jumped from the sudden sensation. The phone fell from my hand. I was leaning against a stinky garbage pile. Madi was attentively watching me. Her togue was red. The dead mouse was in pieces. Is Madi’s togue still colored with its blood?

“Eva what’s happening there. You have to keep talking to me……” My father’s voice faded into the background noise with the rain.

I looked at my elbow. The fresh blood is dripping. I was breathing heavily. But not a single ounce of oxygen entered my lungs. I was pushing myself against the garbage. Madi’s and my eyes connected. Just like the very first day we met. Her eyes were depthless. My eyes were tearful.

Did she …… Did Madi just licked my blood?

She took one slow step towards me. Her eyes are focused on me like she is hunting. I didn’t move a degree. She looked at my bleeding knee and bowed her head to the injury. Then from her togue she slowly licked my blood like a kitty licking milk. I couldn’t even scream. I was full of emotions. She slowly took another step towards me. She was so close to me that even in the heavy rain I could feel the heat radiating from her body. It felt comfortable. This time she opened her mouth reaching for my face. All I could see was sharp teeth and bloody togue before I closed my eyes.

It was Eva who was home for me. She is the only human being that treated me like a friend. All I wanted to do was keep her warm and safe. I didn’t want her to be dripping blood because she was afraid of blood. I tried to lick away the blood and dirt from her beautiful face. She closed her eyes and tears streamed

down her cheeks. I tried to say something assuring. Eva would have understood it if she was okay. But she wasn't well. I understood it as she flinched at my voice.

At the same moment her father arrived with few men. He was so angry. He glared at me while I was licking away the blood from her face. His expression turned even worse. He did something with the plastic object on his palm and a thundering sound echoed through the air. A sharp pain shot up from my stomach.

Then I heard my Eva's high-pitched scream before I drift to an endless sleep. I have to tell my girl how much I admire her bravery. She was so fearless at the sight of those men and not in a single minute she trembled like a normal girl would do. She has grown up to a strong lioness. When I get up I will tell her that I am proud of her. If I get up, I'll tell. I think I am not going to get up. Ever again.

## 11 රුධිර හදවත

( 1815 දී මහනුවර රාජධානිය බිඳවැටුණි.
අපේ කම මැරුණි.)

සෙංකඩගල නුවරට නියඟයකුත් ආවා
වැසි පොද වැටෙන් නැතුව කාලයක්ම තිබුණා
මහ පොළොවට බර දී හුස්ම ගත්ත හින්දා
මහ දවාලෙ මහ පොළොවත් ඉරි තල තල ඇඬුවා

රොබරෝසියා මලුත් පිපෙන් නැතුව හිටියා
කටු අතු උඩ ඉඳගෙන බලාගෙනම හිටියා
වැටෙනා කොළ ගානට අතේ ඇඟිලි මදිවා
එකලස් කර පණ දෙන්නට බැරි දැයි සිතුවා

පර්චස් කෑලිවලට රන් අබරණ හදලා
ගෙල පැලඳා හිස පැලඳා නටන හැටිලු කිව්වා
තෙත් වුණු මහ පොළොවට මිනිස්සු වැඳ වැටුණා
වේලුණු කොපුල් දිගේ කඳුළු බිංදු දිව්වා?

# නිර්නාමික හදවත

# *12 නිර්නාමික හදවත*

(කැමති නම් නමක් දාගන්න.)

කලාගාරය ඉදිරිපිට තිබුණේ එසේ මෙසේ තදබදයක් නෙවෙයි. එක අතකට ඒකත් සාධාරණයි. මොකද ඉතින් මේ ප්‍රදර්ශනය කරන්නේ ලේසියෙන් දකින්න ලැබෙන දෙයක් නෙවෙයි. ටයි කෝට් ඇඳපු මහත්වරුත්, නිල ඇඳුම් ඇඳපු ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිවරාගත් සාරි දවට ගත්තු ගුරුවරුත්, විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන් වගේ, මේ කලාකෘතියේ විශිෂ්ටත්වය සෛද්ධාන්තිකව විඳින්න ආව මිනිස්සු කලාගාරය ඉදිරිපිට අධික තදබදයට මූලික ම හේතුව වෙලා තිබුණා. හැබැයි ඒ අතර රූපවාහිනිය හා සමාජ මාධ්‍ය හරහා කෙරුණු ප්‍රචාරණයට ස්තූතිවන්ත වෙන්න, කලාව කිසිම විදිහකින් අගයන්න නොදන්න නමුත් සමාජයේ රැල්ලට ගසාගෙන ඇවිත් කලාගාරය ඉදිරිපිටට ගොඩගහපු විශාල පිරිසකුත් මේ ජනකාය තුළ හිටියා.

මේ හැමෝම කලාගාරයේ විශාල දොරපියන් ළඟ ඉඳලා මහ පාර වෙනකම් පෝලිමේ පොරකමින් හිටියේ ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පී රාධික් විහාරගේ අසමසම කලා නිර්මාණය නරඹන්නයි. ඒක චිත්‍රයක් කිව්වට ඇත්තටම වෙලා තිබුණේ ජීවය, ලී පුවරුවක් මත ගොඩනැඟීමක්. මේ චිත්‍රයට හුස්මගන්න පුළුවන්.

පණ තියෙන සිතුවමක් නරඹන්න කට්ට අව්වේ වේලි වේලි ඉන්න මිනිස්සු, අපිළිවෙලට අඹරපු කොහු ලණුවක් වගේ කලාගාරය දක්වා පෝලිමේ කෑගගහ හිටියට කලාගාරයේ දොරපියන්වලින් ඇතුළට ආව ගමන් දැනෙන්නේ නීල් ආම්ස්ට්‍රෝන් හඳට ගොඩබහින කොට දැනුණු හැඟීමමයි.

රතු කාපට් එලල තිබුණු පොළොවත්, ලී බිත්තිත්, නිහඬවම හිටියේ අඳුරු කලාගාරයේ අතරින් පතර ආලෝකමත් කරල තිබුණු චිත්‍රවලට කතාව කරගෙන යන්න ඉඩදීලයි.

එක වතාවකට සීමිත පිරිසක් විතරක් කලාගාරය තුළට ගන්න කළමණාකරුවන් තීරණය කළේ කලාත්මක බව විඳින්න නිදහස ඕනම කරන දෙයක් නිසයි. රාධික්ගේ පින්සල් පහරවල් ඉස්සරහ හිටගෙන කලාගාරයේ බිත්තිවලට මුහුණලා හිටිය ඒ මිනිස්සුන්ව පෙනුණේ කාලාවකාශයේ හිරවුණු සිරකරුවන් වගෙයි.

කලාගාරයට හදිස්සියේම ඇතුළු වුණු කලාගාරයේ හිමිකරු අතුකෝරාලට මිනිස්සුන්ව ප්‍රතිමාවලින් වෙන් කරලා අඳුනගන්න බැරි වුණෙත් ඒ නිසයි. මේ නිහඬතාවය බින්දොත් චිත්‍රවල තියෙන මායාව බිඳෙයි කියල හිතෙන තරම් නිහැඬියාවක් කලාගාරය පුරා පැතිරිලා තිබුණා. ඒත් අතුකෝරාලට මේවා

නුපුරුදු දේවල් නෙවෙයි. සාක්කුවෙන් ඇදගත් ලේන්සුවකින් මුහුණ පිසදමමින් ඔහු කලාගාරයේ අභ්‍යන්තරයට හෙමින් හෙමින් පියනැගුවා.

කලාගාරයට ඇතුළු වෙන තැනම තිබුණේ පුංචි පිරිමි ළමයි දෙන්නෙක් වෙල් ඉපනැල්ලේ දුවමින් සෙල්ලම් කරන තෙල් සායම් සිතුවමක්. ඒ පුංචි ළමයි දිහා බැලුව පමණින් ම එයාලගෙ සිනා හඬ ඇහෙනව වගේ දැනෙන තරම් සජීවී බවක් ඒ සිතුවමේ තිබුණා.

අතුකෝරාල චිත්‍ර නරඹන්න නැවතුනේ නෑ. පරදේසක්කාරයින් සමඟ යුද්ධයට යමින් හිටිය මොනරවිල කැප්පෙටිපොළ සෙනෙවියාවත්, ඇලිස්ගේ පුදුම ලෝකයට යමින් සිටි හාවෙක්වත් පහු කරගෙන අතුකෝරාල කලාගාරයේ ප්‍රධාන ම සිතුවම ළඟට ආවා. මිනිස්සු දහයක් දොළහක් විතර ඒ චිත්‍රය ඉස්සරහ හිටගෙන එකිනෙකාට මුමුණගන්න හැටි ඔහු දැක්කා. කහපාට ආලෝකයෙන් නැවිලා දාහක් මිනිස්සු තමන් ගැන කොඳුරන දේවල් නැසුනා වගේ බිත්තියකට හේත්තු වෙලා ඉන්න හැමෝටම බෑ. විශේෂයෙන් මේ වගේ පණ තියෙන හුස්ම ගන්න කෙනෙක්ට බෑ.

චිත්‍රයේ ආරක්ෂාවට නරඹන්නන්ව අඩි කිහිපයක් ඈතිනුයි තියල තිබ්බෙ. චිත්‍රය වටේට දම්වැල්වලින් වට කරල ආරක්ෂකයො දෙන්නෙක්ගේ අධීක්ෂණය යටතේ තිබුණු චිත්‍රය යටින් වැඩි පරිස්සමටත් එක්ක 'නැරඹීමට පමණයි. ඇල්ලීම තහනම්.' ලෙස ලියවුණු පුවරුවක් තිබුණා. අනෙක් හැම සිතුවමකටම රාධික් සිත් ගන්නාසුළු මාතෘකාවක් දාලා තිබුණට මේ සිතුවමට මාතෘකාවක් තිබුණෙ නෑ. බොහෝ සමාජ මාධ්‍ය මේ තත්ත්වය තේරුම් අරන් තිබුණෙ නැති නිසා මේ සිතුවම ජනතාව අතරට ගිහින් තිබුණේ 'ඇල්ලීම තහනම්' යන මාතෘකාවත් අරගෙනයි.

අතුකෝරාල චිත්‍රය වටේ හිටගෙන මුණු මුණු ගාන ජනකාය පහු කරලා දම්වැල් උඩින් පැන්නෙ තම වටකුරු ශරීරය අමාරුවෙන් හසුරුවාගෙනයි. අඩියට දෙකට චිත්‍රයට ළං වුණු ඔහු අනිත් ප්‍රේක්ෂකයන්ට නොලැබෙන සීමාවක ඉඳලා ඒ සිතුවම අධ්‍යයනය කළා.

කළුවර ලීයෙන් හදපු ඝනකම් රාමුවකින් සීමා වුණු ඒ සිතුවම සිතුවමක්ම නෙවෙයි. කොළ පාට ශීත වර්ණයක් විදිහට හඳුන්වන්නේ ඒ පාට දකිනකොට දැනෙන සුවදායක හැඟීම නිසයි. මනසට සිසිලසක් දෙන්න පුළුවන් කොළ පාටක් හදාගන්න රාධික් තීන්ත බෝතල් කීයක් නාස්ති කරල දැම්මද කියලත් අන්තිමට ඒ එක පාටකින්වත් ඒ හැඟීම දැනෙන්නේ නෑ කියල රාධික් තීරණය කරපු විදිහ අතුකෝරාලට තවමත් මතකයි.

තීන්තවලට කරන්න බැරි වුණ දේ කරන්න රාධික් තෝරගත්තේ සැබෑ සෞන්දර්යාත්මක කොළ පාටේ අයිතිකාරයාවයි. සම්පූර්ණ පුවරුව වැහිල තිබුණේ ස්වාභාවික ශාකවලින්. දේශීය ශාකවර්ග විතරක්ම පාවිච්චි කරල

තිබුණ මේ නිර්මාණය කළුවර ලීයෙන් හදපු රාමුව තුළවත් සම්පූර්ණයෙන් හිර වෙලා හිටියෙ නෑ. ගම්මිරිස් කොළ, කුප්පමේනියා මල් එහෙමත් එහෙන් මෙහෙන් එළියට පැනල තිබුණා. ගහක අතු කොළ කඩල ලී පුවරුවක එල්ලන්න තරම් රාධික්ට දරුණු හිතක් තිබුණෙ නෑ. මේ චිත්‍රයට පණ තියෙනව කියල කිව්වෙ ඒකයි. හැම ගහක් ම මලක් ම පණ තිබුණ හුස්ම ගත්ත සජීවි සිතුවමක් මේක. කටරොළු මල් හැමදාම අලුතින් පිපුණේ ඒකයි. වේලුණ කොළ, මල්, ලී රාමුව ඉස්සරහ වැටිල හිටියේ ලෝක ස්වභාවය මතක් කරන්න වගෙයි. ස්වභාව ධර්මයේ සොඳුරු අවස්ථාවක් ග්‍රහණය කරගන්නවා වෙනුවට රාධික් සොබාදහම ග්‍රහණය කරගෙන තිබුණා.

හැමදවසක ම අලුත් සිතුවමක් මේ රාමුව ඇතුළේ තිබුණා. අතුකෝරාල වගේම ගොඩක් මිනිස්සු දිනපතා ඇවිත් බලල ගියේ අද මේ හුස්ම ගන්න සිතුවම කොච්චර වෙනස් වෙලාද කියල දැනගන්නයි. වෙනස්වීම අදියර වශයෙන් නිර්මාණය කරන්න ස්වභාව ධර්මයට තිබුණු හැකියාව ගැන හොඳ අවබෝධයක් ලබාගන්න මේ සිතුවම හැමෝටම උදව්වක් වෙන්න ඇති.

ඒත් මේක මේ විදිහට කවදා වෙනකම් තියෙයිද කියන්න අතුකෝරාලට පුළුවන් කමක් තිබුණෙ නෑ. ගස් වැල් පණ පිටින් තියාගන්න රාධික් පාවිච්චි කරන ක්‍රමය ඒ තරම් ස්ථිර නෑ කියල විතරයි එයා දන්නේ. ඒ නිසාමයි මේ මිනිස්සු කට්ට අව්වේ වුණත් පැය ගණන් ඉඳලා සීමිත අත්දැකීමක කොටස්කාරයෙක් වෙන්න උත්සහ කරන්නේ.

අඩි පහක් දිග අඩි හතරක් උස මේ සිතුවමට අඩි දෙකක පමණ ගැඹුරකුත් තිබුණා. සිතුවම කැලයක් මැද්දෙන් යන ගුරු පාරක පින්තූරයක් වගේ දුර ඉන්න කෙනෙක්ට පෙනුණට ළඟට ආවම අතුකෝරාලට පැහැදිලිව පෙනුණා තණකොළ, උඳුපියලිය, කුප්පමේනියා වගේ පුංචි සාමාජිකයන්ගෙන් පටන් අරගෙන කොත්තමල්ලි, වල් පත්පාඩගම් වගේ පැලැටි තැනින් තැන වැවිලා තියෙන හැටි.අක්කපාන කොළ පෘෂ්ටිමත්ව කැපී පෙනෙන විදිහ. කටුවැල්බටු අතු කිහිපයක් පාර හරහට වැටිලා කටුක ස්වභාවයක් මතු කරන්න දරපු අසාර්ථක උත්සාහයක් වගේම, හීන් බෝවිටියාවල දම් පාට මල් ඒ කටුවල රුදුරු බව සුමට කරල තිබුණ විදිහ දකින්න නෙවෙයි, විඳින්න පුළුවන් කමක් තිබුණා. ටිකක් ඈතට වෙන්න තිබුණෙ නිවිති වැලක්. හැබැයි ඒක පෙනුණෙ මිදි වැලක් වගේ. අඹ ගහක් වගේ පෙනුණ නම නොදන්න ගහක් අතු පතර විහිදිලා හැදිලා තිබුණෙ රාධික් නිල් පාට ගාපු අහස පෙනෙන නොපෙනෙන තරමට ව්‍යාප්ත වෙමිනුයි. ඒ ගහේ හයිය අත්තක තිබුණෙ ස්වභාව දහමේ නිර්මාණයක් නොවුණු කොහු ලණු බැඳපු ඔන්චිල්ලාවක්. ඒක හිස් ඔන්චිල්ලාවක්. ඒත් සොබාදහම ඒක අතහැරලා තිබුණේ නෑ. කටරොළු වැලක් කොහු ලණු වල එතිලා මල් වලින් ඔන්චිල්ලාව හැඩ කරලා තිබුණේ වන දෙවඟනට වෙන් කරපු සිංහාසනයක් වගෙයි.

අතුකෝරාල සිතුවමට උඩින් නම සඳහන් කරන තැන තියෙන හිස්තැන දිහා බලලා බලාපොරොත්තු කඩ වුණ හුස්මක් පහත හෙලුවා. සිතුවමට යටින් ලී පුවරුවක රතු පාට අකුරින් ලියවිලා තිබුණේ 'නැරඹීමට පමණයි. ඇල්ලීම තහනම්' යන පණිවිඩයයි.

අතුකෝරාල දම්වැලෙන් මෙහා පැත්තට ආපහු ඇවිත් කලාගාරයේ විශාල ජනෙල් පියන් අසල තනි රකින කිරිගරුඬ වීනස් ප්‍රතිමාව ළඟින් හිටගත්තා.

" ඇයි ඔයා තාමත් මේකට නමක් දැම්මෙ නැත්තේ?" අතුකෝරාල වීනස් ප්‍රතිමාව දිහා බලල ඇහුවා. හැබැයි වීනස් උත්තර දුන්නේ නෑ.වීනස් වෙනුවට වෙන කටහඬක් උත්තර දුන්නා.

"ඇයි ඔයා නමක් ගැන මේ තරම් හිතන්නේ? මේක ප්‍රසිද්ධිය ගැන ප්‍රශ්නයක් නම් ඔයා පොඩ්ඩක් එළියට බැහැල බැලුවනම් හරි."

අතුකෝරාල වීනස් ප්‍රතිමාවෙ පාදම දිහාට හැඟීම් විරහිත බැල්මක් දැම්මා. ඔළුව හැරුණ අතේ යන මනුස්සයෙක් වගේ ප්‍රතිමාවේ පාදම මත වැටිලා හිටියේ ඒ ප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියා. රාධික් විහාරගේ.

තාරුණ්‍යයෙන් පිරුණු මුහුණකින් වගේම කඩවසම් සිරුරකින් යුතු රාධික් සැහැල්ලු සරල ජීවිතයකට කොයිතරම් ආසයිද කියල බලන ඕන කෙනෙක්ට තේරුම් ගන්න පුළුවන්කම තිබුණා. තැනින් තැන ඉරුණු කලිසම වගේම තීන්ත පැල්ලම් තියෙන සුදු කමිසයත් කඩාහැලෙන දිගු කොණ්ඩ කැලිත් එයාගේ සරල ගතිපැවතුම්වල කැඩපත වුණා. එයා ඉඳගෙන හිටිය තැනින් නැඟිටලා වහල තිබුණු ජනෙල් ළඟට ඇවිදගෙන ගියේ මේ කතාව දිගටම කරගෙන යන්න ඒ තරම් කැමැත්තක් නැතුවමයි.

" ඔයා මේ කරල තියෙන නිර්මාණය අසමසමයි රාධික්. ඒ වුණාට ඒකට අනන්‍යතාවයක් තිබුණොත් තමා ඒක මිනිස්සුන්ගේ මතකයේ රැඳෙන්නේ. කිහිපදෙනෙක්ම මුමුණනවා මට ඇහුණා මේ චිත්‍රෙන් පෙන්නන්නේ මොකක්ද කියලා. ඔයා.." අතුකෝරාල පහත් හඬින් ආපහු සාකච්ඡාව පටන් ගත්තත් රාධික් ජනේලෙන් එළිය බලාගෙන හිටියෙ වෙන සිහියකින්.

එයාගේ තීන්ත ගෑවුණ ඇඟිලි නොසන්සුන්ව ජනේලය මතට තට්ටු කරනවා අතුකෝරාලට පෙනුණා. රාධික්ව හම්බවුණ පළවෙනි දවසෙ ඉඳලා අද වෙනකම් අතුකෝරාල එක දවසක්වත් ඔය ඇඟිලිවල තීන්ත ගෑවිලා නැතුව තියෙනවා දැකලා නෑ. ඒක රාධික්ගේ අපිළිවෙලේ කොටසක් නෙවෙයි අනන්‍යතාවයේ කොටසක්.

" මම මේක නිර්මාණය කළේ නෑ අතුකෝරාල. මේක මගේ චිත්‍ර ප්‍රදර්ශනය. මේ තෙල් සායම් චිත්‍රෙ මම ඇඳපු එකක්. අර කාබන් චිත්‍රෙ මම ඇඳපු එකක්. ඒත් අරක මගේ නිර්මාණයක් නෙවෙයි. චිත්‍ර ශිල්පියෝ කොච්චර ඉන්නවද

සොබාදහමේ අවස්ථා ඇඳලා තීන්තවලින් පණ දෙන. ඒ හැමෝම කියන්නේ සොබාදහම තමා හොඳම කලාකාරයා කියලා. එහෙම කියන කවුරුවත් අද වෙනකම් තමන්ගේ කලාගාරයේ, තමන්ගේ චිත්‍ර ප්‍රදර්ශනයේ තැනක් සොබාදහමට දීලා තියෙනවද? මම කළේ පැළවලට මැරෙන්නෙ නැතුව ඉන්න පුළුවන් ක්‍රමයක් හදපු එකයි, මගේ ප්‍රදර්ශනයේ චිත්‍ර අතර සොබාදහමේ නිර්මාණයකට අවස්ථාවක් දීපු එකයි විතරයි. ඒ හැමදෙයක්ම කළාට පස්සේ මිනිස්සු මගෙන් අහනවා ඒකෙ නම මොකක්ද කියල.'' රාධික්ගේ කටහඬේ කේන්තියක් තිබුණෙ නෑ. මිනිස් ජනගහනය ගැන කලකිරීමක් විතරයි ඒ වචනවල තිබුණේ. ''මේ මිනිස්සුන්ගේ නිර්මාණශීලීත්වය ඒ තරමට මොට වෙලාද?''

''කලාව රසවිඳින හැමෝම ඔයා වගේ දාර්ශනික මිනිස්සු නෙවෙයි රාධික්. ඔයාගෙ ඔය අදහස වචන කරල අර චිත්‍රෙට උඩින් ගහන්න. මේ දැන් කියපු විස්තරේ සුපිරි. ඒ අදහස කෙටි කරල මාතෘකාවක් විදිහට දැම්මහැකි.'' අතුකෝරාල රාධික්ගේ උරහිසට තට්ටුවක් දාන ගමන් එහෙම කියල එතනින් යන්න ගියේ වර්තමාන ආවේගශීලී තාරුණ්‍යයට හිතින් බැන බැනමයි.

'' මේක තේරුම් ගන්න පුලුවන් එක මනුස්සයෙක්වත් නැද්ද අත්තටම?'' රාධික් බලාගෙන හිටියෙ පෝළිමේ පොරකමින් සොබාදහමේ සහ රාධික්ගේ සම දායකත්වයෙන් නිමවපු නිර්මාණය බලන්න එන මිනිස්සු දිහා. ''නමක්? මගේ හැම චිත්‍රෙකටම මම මොකක් හරි වචන ටිකක් ගැටගහලා නමක් දැම්මනේ. ඒත් මේක....'' මොකක් හරි ප්‍රශ්නයක් ආවම තමන් එක්කම විද්වත් මණ්ඩල සාකච්ඡාවක් තියලා සාමූහිකව තීරණයකට එන එක තමා රාධික්ගේ පුරුද්ද වෙලා තිබුණේ. '' මේකේ මොකක් හරි අඩුවක් තියෙනවා. මට නමක් හිතාගන්නම බැරි ඒ නිසයි.''

ජනේලයට පිට තියල හේත්තු වුණ රාධික් එයාගෙ නිර්මාණය ඉස්සරහ ඉන්න මිනිස්සුන්ගේ අතරින් එබි එබි හුස්ම ගන්න චිත්‍රය දිහා බැලුවා.

චිත්‍රයේ අයිතිය තමන්ට නෙවෙයි සොබාදහමට කියලා රාධික් කිව්වා තමයි. ඒත් රාධික් කියන්නෙත් සොබාදහමේ තවත් එක සිතුවමක් නේද?

''අපි හැමෝම සොබාදහමට බද්ධ වෙලා ඉන්නේ. කළුවර ලීයෙන් හදපු දරදඬු රාමුවකට කොටු වුණත් ඇතුළෙ තියෙන්නෙ පණ තියෙන හුස්ම ගන්න ජීවිතයක්.......'' රාධික් ආපහු ජනේලෙන් එළිය බලාගෙන තව ටිකක් කල්පනා කරන්න ගත්තා. '' හරි, මම මේකට එකතු කරන්න ඕන.....ඒ ඇතුළෙ තියෙන මිනිස් ජීවිතය සංකේතවත් කරන දෙයක්. සොබාදහමට බද්ධ වුණ, වෙන් කරන්න බැරි, පණ තියෙන ජීවිතයක්. දෙවෙනි හදවතක් වගේ මිනිස් ශරීර කූඩුව ඇතුළෙ හුස්ම ගන්න දෙයක්...නිර්නාමික හදවතක්.'' රාධික් ආවේගයෙන් ජනේලයට පහරක් ගැහුවා. අන්තිමේදි නමක් හදාගත්තු එක

ගැන එයාගෙ හිතේ පුංචි උද්දාමයක් ඇති වුණා. ඒත් කොහොමද නිර්නාමික හදවතක් පෙන්නන්නේ? හැම මනුස්සයෙක්ගෙම හිතේ ඉන්න පුංචි ළමයව නියෝජනය කරන්න ගැළපෙන්නේ මොන වගේ දෙයක්ද?

" පුංචි ගෑනු ළමයෙක්. අර ඔන්චිල්ලාව උඩ." රාධික්ගේ ඇස් රැඳිලා තිබුණේ සෙනඟ අතරින් එබි එබි පෝළිමේ ඉන්න පුංචි ගෑනු ළමයෙක් ළඟ. රතු පාට රැලි රැලි ගවුමක් ඇඳලා කොණ්ඩ කරල් දෙකක් ගොතාගෙන හිටිය ඒ චූටි කෙල්ලගේ මූණෙ තිබුණෙ හරිම හුරතල් පෙනුමක්. රාධික් තොල් අඟින් ගත්තු හිනාවක් එක්ක කලාගාරයෙන් එළියට ආවෙ බෝඩ් කෑල්ලක 'නිර්නාමික හදවත' කියල ලියල චිත්‍රෙට උඩින් එල්ලන්න කියල සේවකයෙක්ට කිව්වට පස්සෙයි.

නිර්මාණයට අලුතින් එකතු කරන්න කොටසක් හොයාගන්න එළියට බැස්ස ගමන් දැඩි අව් රශ්මියට පස්සේ රාධික්ට තදින්ම දැනුණෙ මිනිස්සුන්ගේ කසු කුසු ගෑම එයා එළියට බැස්ස ගමන් වැඩි වුණ එක. ඒක ගනන් ගන්න තරම් කාලයක් රාධික් එතන රැඳුණෙ නෑ. පෝළිමේ ඉන්න මිනිස්සු රාධික් එයාලව පහු කරන් යනකොට එයා දිහා බලන්න පේළියට ඔළු හැරෙව්වත් එක්කෙනෙක් නම් රාධික්ව දැක්කෙවත් නෑ.

රතු ගවුම ඇඳපු ගෑනු ළමයා ඒ ළඟ තණකොළ ගහක තිබුණ චූටි මලක් ළඟ වාඩිවෙලා හරිම උනන්දුවෙන් ඒ දිහා බලාගෙන හිටියා. රාධික් එයා ළඟට ඇවිත් හොඳටම බිමට පහත් වුණා. චූටි කෙල්ල නම් පොළොවට හුඟක් ළඟ වුණාට රාධික්ට අඩි කිහිපයක් පහළට නැවුනට පස්සෙ තමා අර ලස්සන තණකොළ මල පෙනුණේ.

"ලස්සනයි" එතරම් සමාජශීලී නොවුණු රාධික් මල දිහා බලාගෙන කිව්වා.

"හැම මලක්ම ලස්සනයි තමා." චූටි කෙල්ල හුරතලේට රාධික් දිහාට හැරිලා කියල නැඟිට්ටා. රාධික් හිනාවෙලා කෙලින් වුණේ, මේ කෙල්ලවම උස්සගෙන ගිහින් අර චිත්‍රෙ මැද්දේ ඔන්චිල්ලාව උඩින් තියන්න බැරිද කියල හිතන ගමනුයි.

"ඔව්" රාධික් එයාගේ ගමන යන්න හැරිලා ගෑනු ළමයාගේ ඔළුවට තට්ටුවකුත් දාලා කලාගාරයේ ගේට්ටු දිහාට ඇවිදගෙන ගියා.

"යෙනූ" තරුණ ගෑනු ළමයෙක්ගෙ කටහඬින් ගැස්සිලා ගිය චූටි ගෑනු ළමයා ඒ කතා කරපු කෙනා දිහාට දුවගෙන ගියා. තවත් තරුණ පිරිසක් එක්ක එකතු වෙලා සමාජ මාධ්‍ය කලඹපු සිතුවම බලන්න ඇවිත් හිටිය එයාගේ තරුණ සහෝදරිය ටිකක් තදින් යෙනූ දිහා බැලුවා.

"ඔයාට කිව්වා මම එහෙ මෙහෙ දුවන්න එපා කියලා. දැන් අපිට ඇතුළට යන්න දෙයි. මුකුත් අල්ලන්න එපා. මාත් එක්කම ඉන්න ඕන හරිද? ඔයා

මොනාහරි අල්ලල කැඩුවොත් ඔයාව තියල යන්න වෙයි. තේරුණාද?" අක්කා ටිකක් බය වෙන විදිහට කියන කොට යෙනූ හරිම කීකරු විදිහට ඔළුව වැනුවා.

අක්කගෙ විශ්වවිද්‍යාල යාළුවො ගොඩ හරිම කලබලකාරී උනත් යන්නම ඕන කියල යෙනූ රණ්ඩු කලේ ටීවී එකේ මේ බලන්න යන චිත්‍රෙ දැකපු වෙලාවෙ ඉඳලා ඒක ඇත්තටම ඇස් දෙකෙන් බලාගන්න ආපු ආසාවටමයි.

කලාගාරයේ විශාල දොරපියන් ඇරුණා. තරුණ ළමයි රංචුවක් එළියට පැන්න පරක්කුවට යෙනූටත් එයාගේ අක්කගෙ යාළු නඩයටත් ඇතුළට යන්න පුළුවන් වුණා. යෙනූ හිතුවට වඩා ඇතුළ හරිම නිශ්ශබ්දයි. කොච්චර නිශ්ශබ්ද ද කිව්වොත් යෙනූට බය හිතුණා. අක්කගෙ යාළුවො පහත් හඬින් ඒගොල්ලො අතර විහිළු කරගන්නවත් ඒවට හිනාවෙන්නෙ නැතුව ඉන්න දඟලනවත් යෙනූට පෙනුණට ඒව බල බල ඉන්න එයාට උවමනාවක් තිබුණෙ නෑ.

කලාගාරයේ මිනිස්සු තැන තැන විසිරිලා තිබුණට ටිකක් ඇතුළට වෙන්න ප්‍රේක්ෂකයෝ තොගයක් පොරකනවා දැක්කම ඒ මොකක්ද කියල හිතාගන්න යෙනූට අමාරු වුණේ නෑ.

අක්කවත් එයාගෙ උපදෙසුත් මතකයෙන් මැකිලා යද්දී යෙනූ හීනෙන් වගේ කලාගාරය ඇතුළටම ගියා. යාළුවොත් එක්ක හිනාවෙවී හිටිය අක්කටත් එයාව ඒ තරම් අවධාණයට ලක් වුණේ නෑ.

මිනිස්සු මී මැස්සො වගේ වට වෙලා හිටිය නිසා ඒ මිනිස්සුන්ගේ කකුල් විතරයි යෙනූට පේන්න තිබුණේ. මේ මිනිස්සු මොකට මෙච්චර උස යනවද මන්ද කියල යෙනූට හිතුන පළවෙනි වතාව මේක නෙවෙයි.

එයා දණගහගෙන කතාවල්වල පැටලිලා මුණු මුණු ගාන මිනිස්සු අතරින් රිංගලා ආවා.දම්වැල්වලින් වට කරලා තිබුණ කවය ඇතුළටත් කාටවත් ළං වෙන්න නොලැබුණු තරම් ඒ චිත්‍රෙට ළං වෙන්නත් යෙනූට පුළුවන් වුණා. ඔව් සමහරවිට, අතුකෝරාලට විතරක් ඒ තරම් ළං වෙන්න පුළුවන් වෙන්න ඇති. චිත්‍රෙ ළඟටම ඇවිත් නැඟිටපු යෙනූ මෝහනය වෙලා වගේ විනාඩියක් මේ පුදුමය දිහා බලාගෙන හිටියා. එයාට හිතුණෙ මේ නිර්මාණය කරල තියෙන්නෙ මායාකාරයෙක්ගේ අත්වලින් කියලමයි. ඒ අත්වලින්ම එයාටත් ස්පර්ශයක් ලැබුණා කියල එයා දැනගෙන හිටියෙ නෑ.

වැඩිහිටි මිනිස්සුන් අලුතින් නම් කරපු චිත්‍රය ගැන අදහස් හුවමාරු කරගන්න අතර කාටවත් යෙනූව පෙනුනෙ නැති තරම්. අඩුම තරමේ ආරක්ෂාවට හිටිය අයවත් මේ චූටි කෙල්ල රාධික්ගේ විශිෂ්ටම නිර්මාණය අල්ලනව දැක්කෙ නෑ.

උඳුපියලියවල සුවඳ, අක්කපාන කොළවල පෘෂ්ටිමත්බව ඇඟිලිතුඩුවලින් පිරිමදින්නත් කටුවැල්බටුවල තියුණු බව හමුවේ 'ඌයි' කියල අත අහකට ගන්නත් ආපහු ධෛර්යය අරගෙන හීන් බෝවිටියා මල්වල සිනිඳු බව විඳින්නත් යෙනූට පුළුවන් වුණා. ඒත් එයාගේ ඇඟිලි නතර වුණේම ඔන්චිල්ලාවේ කොහු ලණුවල එතිල තිබුණු කටරොළු මල්වල. එයා ඇඟිලි තුඩුවලින් ඉස්සිලා කටරොළු මල්වලට මූණ ළං කලේ ඒ මල්වල සුවඳ බලන්න හිතාගෙනයි. නිල් කටරොළු මල් පෙති යෙනූගෙ කම්මුල්වල වැදෙනවත් එක්කම එයා ගැඹුරු හුස්මක් ගත්තා.

අතුකෝරාල දවල් කෑමට පරක්කු වෙන නිසා රාධික්ව එයාගේ මාතෘකාව හිතන වැඩෙට දාලා ගියාට ආපහු එනකොට තීන්ත බාල්දියක් උස්සගෙන යන කලාගාරයේ සේවකයෙක්ව දැකල එයාට පුදුම නොවී ඉන්න බැරි වුණා. රාධික් නමක් දැම්මා කියල අහපු ගමන් අතුකෝරාල වෙන මුකුත් අහන්න එතන හිටියේ නෑ. කලාගාරයේ පිටිපස්සේ දොරෙන් ඇතුල් වුණ අතුකෝරාල කලාගාරයේ මැදම තිබුණ රාධික්ගේ විශිෂ්ටම නිර්මාණය දිහාට දුවගෙන ආවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ හොඳටම පිරිලා එතන.

අතුකෝරාල දම්වැල් උඩින් පැනලා චිත්‍රය ළඟට ගියා. මුලින්ම එයාගෙ ඇහැ ගැටුනෙ සුදු පාට පුවරුවක රතු පාට තීන්තවලින් ලියල තිබුණ 'නිර්නාමික හදවත' කියන නමට. නොදැනුවත්වම ආඩම්බරෙන් හිනාවුණු අතුකෝරාල චිත්‍රය දිහා ආපහු බැලුවෙ මාතෘකාව චිත්‍රයට සම්බන්ධ වෙන තැන හොයාගන්න හිතලයි. එතකොටයි එයා දැක්කේ කලින් තිබුණෙ නැති දෙයක්. පාළුවට ගිහින් තිබුණ ඔන්චිල්ලාව උඩ රතු පාට මලක් වගේ චූටි ගෑනු ළමයෙක් හිටියා. එයා හිනාවෙනවා වගේ පෙනුමක් තිබුණෙ. එයාගෙ චූටි ඇඟිලි කටරොළු මල් වැල් වටේ එතිලා. රතුපාට ගවුම හුළඟට විසි වෙනවා. මලකින් බොහොම අමාරුවෙන් මේ රූපය හදල තියෙන බව අතුකෝරාලට තේරුණා. චිත්‍රයේ මායාව සම්පූර්ණ වෙලා තියෙන නිසා තවත් මේක ළඟට වෙලා ඉන්නෙ නැතුව අතුකෝරාල දම්වැල්වලින් මෙහා පැත්තට පැනල සෙනඟ පිරුණ තැනින් ටිකක් ඈත් වුණේ රාධික්ව හොයාගන්න හිතාගෙනයි.

ඒත් එක්කම රාධික් කලාගාරයේ දොර ඇරගෙන ඇතුළට ආවා. අතුකෝරාල කෙලින්ම ගිහිල්ලා එයාගෙ කරට අතක් දාගත්තා.

" නියම වැඩක්. ඔය කරලා තියෙන්නේ හොඳටම. බොරුවටනෙ නහයෙන් අඬලා තියෙන්නෙ."අතුකෝරාල රාධික්ව ප්‍රශංසා කරන්න ගත්තා.

"මොකක්? ආහ්...නමද?" රාධික් අන්දුන් කුන්දුන් වෙලා ඇහුවා.

“නමත් හොඳයි. වැඩත් හොඳයි. සුපිරියිනෙ කොල්ලෝ. අපිට ලොකු ගමනක් තියෙනවා යන්න. ඔහොම යමු.” අතුකෝරාල රාධික්ව අතහරින්නෙ නැතුවම වර්ණනාව කරගෙන ගියා. “ඉස්සෙල්ලම එළියට ගිහින් මොනාහරි කාල එමු. ඔයා දවල්ටත් කාලා නැනෙ. ඔයා වෙනුවෙන් මට තව පාරක් වුණත් දවල්ට කන්න පුළුවන්.”

“මට තව දෙයක් තියෙනවා චිත්‍රෙට එකතු කරන්න ඕන.” රාධික් කෙඳිරිගාන්න ගත්තෙ අතේ තිබුණු රතු පාට මල් ජාතියක් අතුකෝරාලට පෙන්නන ගමන්මයි.

“අයියෝ රාධික්.....ආපහු මුකුත් එකතු කරන්න ඕන නෑ. ඔයා කරල තියෙන හරිය හොඳටම ඇති. දැන් ඔයාට ඕන කරන්නේ පොඩි විවේකයක්. එන්න යමු.” අතුකෝරාල රාධික්ව උරහිසෙන් ඇදගෙන, කලබල වෙලා වටපිට බල බල හිටියෙ විශ්වවිද්‍යාල සිසුන් පිරිසක් පහුකරගෙන කලාගාරයෙන් එළියට ආවා.

# ස්තූතිය

මෙම ව්‍යාපෘතිය සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති මැණියන්ටත් සෙනෙවිරත්න ගුරු පියාණන්ටත් සුවහසක් ලේඛක අංකුරවලට සුපුෂ්පිත වීමට මං පෙත් තැනීම පිළිබඳව මාගේ කෘතවේදීත්වය පළ කරමි. ජීවිතය දරාගැනීමට නොව වැළඳ ගැනීමට හුරු කළ විශාකා විදු මවට ද අකුරින් අකුර මා ගොඩනැගූ සියලුම ගුරු මැණිවරුන් හා පියවරුන්ට ද ජීවිතේ පළවෙනි පොත ලියන්නට මා පෙළඹවමින් මා තුළ වූ ලේඛිකාව අවදි කළ නිරූපා වෙලගෙදර ගුරුමැණියන්ට ද මගේ ගෞරවනීය ස්තූතිය පුදකරමි. නම් ගම් වුව සොරාගන්නට ඉඩ දී බලාසිටි මගේ වැටුප් නොලබන කියවන්නන්ගේ සංගමයේ සාමාජිකයින් වන යෙනුකි, සවීනා, අමාදි, සිත්මි, ඩිනෙත්මි, චමෝදි(පූස්) ඇතුළු මගේ ජීවිත කතාවේ චරිතයක් වූ සියල්ලන්ට හද පිරි ස්තූතිය පුද කරමි. මා විසින් පොතක් ලිවීමට තීරණය කළ නිසා පිටකවර සැදීමේ සිට අවසාන පිටුව දක්වා උදව් උපකාර කළ ද මා යුද්ධයක් කරන්නට තීරණය කළොත් සේනාව මෙහෙයවීමට වුව ද හැකියාවක් ඇති ඉවැන්ජිටත්, මටවත් නැති තරම් මගේ හැකියාවන් ගැන විශ්වාසයක් තියාගෙන ඉන්න අයියාටත්, මගේ මැදියම් රැයක් වන් ජීවිතය ඒකාලෝක කරමින් චන්ද්‍රමණ්ඩලයක් වන් සෞම්‍ය ප්‍රේමයකින් මා ශක්තිමත් කරන අප්පච්චිටත්, ඉස්පිලි පාපිලි නැති කතාවක් මේ මට්ටමට ඔප දමපු, මගේ බටහිර අහස දෙවනත් කළ ලහිරු මඩල වන අම්මිටද අසීමිත ආදරයකින් ස්තූතිවන්ත වෙමි. විශේෂයෙන්ම, සම්පූර්ණ පොතක් ලියන්නට තරම් මාව ධෛර්යමත් කරපු, වචනෙන් වචනෙ කතාවක් අමුණන්න පුලුවන් බව ඒත්තු ගැන්වූ, අමාරුම වෙලාවලදීත් තනි නොකරපු, මට ද මම ස්තූතිවන්ත වෙමි.



සයුනි ඇම්බ්‍රෝස්

විශාඛා විද්‍යාලය,

කොළඹ 05.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම හා එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මකබවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවන් ඩිජිටල් වේදිකාවක් ගොඩනඟා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්.

# Hearts are similar in one way.

# They all beat.

# Yeah, they are beasts.

...........මතක් වෙන සැරයක් සැරයක් ගානෙම හිතට දැනෙන බර හැඟීමත් එක්ක තරුවකටත් වඩා ඇවිළෙන ගින්නක් ඒ දරදඬු හදවතේ තිබුණෙ..........................

-කඩදාසි හදවත-

හුස්ම අල්ලන්නෙත් එළිසමය ගැළපෙන්න
සුසුම් හෙළන්නෙත් විරිත නොකැඩෙන්න

-කවි හදවත-

................කටරොළු වැලක් කොහු ලණුවල එතිලා මල්වලින් ඔන්චිල්ලාව හැඩ කරල තිබුණේ වනදෙවඟනට වෙන් කරපු සිංහාසනයක් වගෙයි.............

-නිර්නාමික හදවත-

......Carnivorous creatures are just what they are. Eventually they are just animals.

Aren't we all?...........

-The Untamed Heart-